(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 2(10).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2011 මාර්තු මස 09 වැනි බදාදා

## 2011 මාර්තු මස 22 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0578/’10

ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාර්ෂිකව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා පිටවන වෛද්‍යවරු සංඛ්‍යාව කවරේද;

(ii) වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන විදේශ වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කවරේද;

(iii) ඉහත කී උපාධිධාරීන් වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා පවත්වනු ලබන විභාග, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන්නේද සහ 2010.01.01 දින සිට එය වෙනත් අධිකාරියකට පවරා තිබේද;

(iv) එසේ පවරා තිබේ නම්, එම නව අධිකාරියේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසරක කාලයක් සඳහා මෙරටට අවශ්‍ය වන වෛද්‍යවරු සංඛ්‍යාව කවරේද;

(ii) වෛද්‍යවරයකුට ගෙවනු ලබන සාමාන්‍ය වැටුප කවරේද;

(iii) ඔවුන්ට ලබාදී ඇති අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

(iv) ශ්‍රී ලංකාවේදී සුදුසුකම් ලැබූ වෛද්‍යවරුන් හට නිවාඩු ලබා විදේශගත වීමට අවසර තිබේද;

(v) එසේ නම්, ඔවුන්ට එලෙස නිවාඩු ලබාගෙන විදේශ ගතවීම සඳහා අවසර ලබාදෙන කාලසීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0726/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගිරාතලාන උතුර මාර්ගය අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයට තාර දැමීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයට තාර දැමීම භාරදුන් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද ;

(iii) එම ඇස්තමේන්තුව අනුව තාර දැමීම සිදුකළ යුතු දුර ප්‍රමාණය හා පාරේ පළල කොපමණද ;

(iv) මේ වන විට තාර දමා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) තාර දැමීම අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) එම මාර්ගයට තාර දැමීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බවත්, මේ වන විට බොහෝ ස්ථාන ගිලා බැස ඇති බවත්, නියමිත දුර ප්‍රමාණය තාර දමා නොමැති බවත් එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන ඉදිකිරීම් කළ ආයතනය හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0887/'10

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දඹුල්ල නගරයේ හා ආර්ථික මධ්‍යස්ථානය ආශ්‍රිත ප්‍රදේශයේ දෛනිකව එකතු වන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ඉනාමළුව වන රක්ෂිතයට බැහැර කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ හේතුවෙන් ඉනාමළුව රක්ෂිතය තුළ විශාල පරිසර හානියක් සිදුවෙමින් පවතින බවත්;

(ii) එසේ බැහැර කරනු ලබන අපද්‍රව්‍ය සමග ඇති පොලිතීන් හා ප්ලාස්ටික් කැබලි ආහාරයට ගැනීම නිසා එම රක්ෂිතයේ වන ජීවීන්ගේ ජීවිතවලට විශාල තර්ජනයක් එල්ලවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉනාමළුව වන රක්ෂිතයට සිදුවෙමින් පවතින පරිසර හානිය වළක්වා ගැනීමටත්, එහි වන ජීවීන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමටත් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0889/'10

ගරු තිස්ස අත්තනායක මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සන්තකය ආපසු පවරා ගැනීමේ පනත යටතේ වර්ෂ 2000 සිට 2008 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ, මිනිපේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අත්පත්කරගත් ඉඩම් ප්‍රමාණය, එම ඉඩම් හිමියන්ගේ නම්, ලිපිනයන් හා ග්‍රාම නිලධාරී වසම් කවරේද;

(ii) එම කාලය තුළ ආපසු පවරාගත් පල්ලේවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ජී. එම්. පුංචිබණ්ඩා මහතා පදිංචිව සිටි ගොඩනැගිල්ලට, ළිඳකට හෝ ඉඩමට මහා මාර්ග අමාත්‍යාංශයේ ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය මගින් වන්දි ගෙවා තිබේද;

(iii) එසේ නම්, වන්දි ලෙස ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පුංචිබණ්ඩා මහතා විසින් කූට ලේඛන සකසා එම ඉඩමට විදුලිය ලබාගෙන ඇති බවත්, එම ඉඩමට බලපත්‍රයක් ලබා ගැනීමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමතියට අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉඩම් ආපසු පවරා ගැනීමේදී පුංචිබණ්ඩා මහතාට ගෙවා ඇති වන්දි මුදල් ආපසු ලබා ගැනීමටත්;

(ii) උක්ත ඉඩම වෙනුවෙන් වැරදි සහගත ලෙස බලපත්‍රයක් ලබාදීමට, එහි දේපලට වන්දි මුදල් ගෙවීමට, විදුලිය ලබාදීමට උපදෙස් දුන් හා අනුමත කරන ලද නිලධාරීන්ට විරුද්ධව ක්‍රියා කිරීමටත්;

පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0891/'10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැප්පෙටිපොල විශේෂ ආර්ථික මධ්‍යස්ථානය ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් වැලිමඩ එළවළු ගොවීන් අසීරු තත්ත්වයට පත්ව ඇති බවත්;

(ii) තම එළවළු සඳහා හොඳ මිලක් නොලැබීම මෙන්ම තම නිෂ්පාදන සඳහා නිසි පරිදි මුදල් නොගෙවීම හේතුවෙන් මෙම ආර්ථික මධ්‍යස්ථානය ගොවීන්ගේ විශ්වාසනීයත්වය ගිලිහී ගිය, ස්ථානයක් බවට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තත්ත්වය මග හරවා වෙළෙන්දා හා ගොවියා අතර ගැටලු මතු නොවන, ගොවීන් තුළ ආර්ථික මධ්‍යස්ථානය පිළිබඳව විශ්වාසය වර්ධනය කළ හැකි වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීමටත්;

(ii) මෙම ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳසැල් පරීක්ෂා කිරීම සඳහා මිල පාලන ඒකකය හා කිරුම් මිණුම් ඒකකයේ සහය ලබා ගෙන ගොවීන් සූරා කෑම අවුරාලන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමටත්;

කඩිනමින් කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0897/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කල්පිටිය අසල ඇති දූපතක් දේශීය හෝ විදේශීය සමාගමකට හෝ පුද්ගලයෙකුට බදු දී තිබේද;

(ii) එසේ නම්, එම දූපත කවර කටයුත්තක් සඳහා, කුමන කාලසීමාවකට, කොපමණ මුදලකට බදු දුන්නේද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දූපත බදු දී ඇති සමාගමේ හෝ පුද්ගලයාගේ නම කවරේද;

(ii) එම දූපත බදු දීමට අදාළ බදු ගිවිසුම මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0602/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂයේදී සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල විසින් මිලදී ගනු ලැබූ සියලු කොටස් කවරේද;

(ii) ඉහත සඳහන් කොටස්වල ගැනුම් මිල සහ වත්මන් යළි විකුණුම් මිල කවරේද;

(iii) කොටස් මිලදී ගනු ලැබුවේ ලැයිස්තුගත සමාගම්වලින්ද;

(iv) නොඑසේ නම්, ලැයිස්තුගත නොකළ කොටස් මිලදී ගැනීමට හේතුවූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ලැයිස්තුගත කළ සහ ලැයිස්තුගත නොකළ සමාගම් බොහෝමයක සුළුතර කොටස් ප්‍රමාණ මිලදීගැනීම රජයේ ප්‍රතිපත්තියක් ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0839/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රූපවාහිනී සංස්ථාව, 2010 වර්ෂය සඳහා යාවත්කාල සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කර තිබේද;

(iii) 2006 වර්ෂයේ සිට මේ දක්වා මැතිවරණ පැවති කාලසීමාවන් තුළ රජයේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ජාතික රූපවාහිනිය වෙන් කළ කාලයන් සහ ඊට අදාළව කළ ගෙවීම් කවරේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා රූපවාහිනී සංස්ථාවට කළ බඳවා ගැනීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බඳවා ගැනීම් සිදු කළ තනතුරුවලට අදාළ සුදුසුකම් සහ බඳවාගත් අයගේ සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0894/'10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික තරුණ සේවා සභාව යටතේ පවතින ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයට අනුබද්ධිත ලියාපදිංචි යෞවන සමාජ සංඛ්‍යාව කොපමණද;

(ii) එම යෞවන සමාජ අතරින් ක්‍රියාකාරී යෞවන සමාජ සංඛ්‍යාව කොපමණද;

(iii) ක්‍රියාකාරී යෞවන සමාජවල මුළු සාමාජික සංඛ්‍යාව කොපමණද;

(iv) එම සාමාජික සංඛ්‍යාව මීට වර්ෂ 5 කට කලින් පැවති සාමාජික සංඛ්‍යාව හා සැසඳීමේදී ප්‍රමාණවත් ලෙස වැඩිවී තිබේද;

(v) නොඑසේ නම් අඩු වී තිබේද;

(vi) ක්‍රියාකාරී යෞවන සමාජයන්හි වත්මන් මුළු සාමාජිකත්වය සෑහීමකට පත්විය හැකි සංඛ්‍යාවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0898/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට වරායට කරදිය පිරවීම සඳහා පැවැති උත්සවය සඳහා වියදම් කරන ලද මුදල් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) එසේ වියදම් කරන ලද මුදල් ලබාගත් අයගේ තොරතුරු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0910/'10

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව මගින් පාලනය වන තේ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) තේ වෙන්දේසිවලදී එම තේ වතුවලින් කසළ තේ ලෙස මාසිකව ඉවත් කර ගනු ලබන තේ ප්‍රමාණය කොපමණද;

(iii) 2010 අගෝස්තු මාසය තුළ කැලෑ බොක්ක වතුයාය හා ගල්පිහිල්ල වතුයාය මගින් නිපදවූ තේවලින් පරිභෝජනයට නුසුදුසු යැයි පවසා තේ වෙන්දේසිවලදී ඉවත්කොට ඇති තේ කිලෝග්‍රෑම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එමගින් සිදු වූ දළ පාඩුව කොපමණද;

(v) එවැනි පාඩුවක් සිදුවීමට හේතු සොයා බලා එවන් තත්ත්වයක් නැවත ඇති නොවීම සඳහා ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0913/'10

ගරු තිස්ස අත්තනායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 වර්ෂයේදී කිරිබත්ගොඩ විහාරමහාදේවි බාලිකා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමට පැවති සම්මුඛ පරීක්ෂණයෙන් පසුව පාසලට ඇතුළත් කරගත්, පොරොත්තු ලේඛනයේ සිටි හා පොරොත්තු ලේඛනයේ සිට ඇතුළත්කර නොගත් එක් එක් ශිෂ්‍යාවගේ නම, ලිපිනය හා ලබාගත් ලකුණු සංඛ්‍යාව කවරේද යන්න, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ විශේෂ නියෝග මත එම පාසලට ඇතුළත් කළ ශිෂ්‍යාවන් පස් දෙනාගේ නම්, ලිපිනයන් ලබාගත් ලකුණු සංඛ්‍යාවන් සහ විශේෂ හේතුව කවරේද;

(ii) 2010 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ නියෝග මත අධ්‍යාපන ලේකම්වරයාගේ චක්‍රලේඛයට සම්පූර්ණයෙන් පටහැනිව විදුහල්පතිනිය විසින් ඇතුළත් කළ, සම්මුඛ පරීක්ෂණයේදී අඩු ලකුණු ලැබූ ශිෂ්‍යාවන් 18 දෙනාගේ නම්, ලිපිනයන් හා ලකුණු සංඛ්‍යාවන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත පරිදි අධ්‍යාපන ලේකම්වරයාගේ චක්‍රලේඛයට හා අමාත්‍යතුමාගේ ප්‍රතිපත්තිවලට පටහැනිව ළමුන් පාසලට ඇතුළත් කළ නිලධාරීන්ට හා විදුහල්පතිනියට විරුද්ධව අල්ලස් හා දූෂණ පනත හෝ වෙනත් නීතියක් යටතේ දඬුවම් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0645/’10

ගරු රවී කරුණානායක මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික අංශයේ අවම වැටුප් වැඩිකරනු ලබන දිනය කවරේද;

(ii) පෞද්ගලික අංශයේ විවිධ සේවක ගණයන් සඳහා වැඩිකිරීමට නියමිත වැටුප් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉකුත් වසර 10 ක කාලසීමාව තුළ පෞද්ගලික අංශ සේවකයන්ගේ වැටුප් වැඩිකරනු ලැබූ අවසන් අවස්ථාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අංශයේ වැටුප් වැඩිකරනු ලබන දිනය කවරේද;

(ii) වැඩිකිරීමට නියමිත වැටුප් ප්‍රමාණය කොපමණද;

(iii) රාජ්‍ය සේවයේ විවිධ සේවක ගණයන් සඳහා වන අවම විශ්‍රාම වැටුප් සහිත වැටුප් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0840/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා පිඟන් සංස්ථාවේ වත්මන් සභාපතිවරයාගේ හෝ පත් කළ නිසි බලධාරියාගේ නම සහ සුදුසුකම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා පිඟන් සංස්ථාවට අයත් වැඋඩ උළු ගඩොල් කර්මාන්ත ශාලාව පිහිටි ඉඩමේ අයිතිය හිමි අය කවුරුන්ද;

(ii) එම ඉඩම විකිණීමට හෝ බදු දීමට තීරණය කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වැ උඩ උළු ගඩොල් කර්මාන්ත ශාලාවේ සේවය කරන සේවක සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඔවුන් වෙනුවෙන් ලැබිය යුතු ජීවන වියදම් දීමනාව සහ අර්ථ සාධක අරමුදල් 2010 නොවැම්බර් මාසය වන තෙක් ලැබී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම දීමනා ඔවුන්ට ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0895/’10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝක උරුමයක් වූ බෝගොඩ රජමහා විහාරය සහ ඓතිහාසික බෝගොඩ ලී පාලම ඇති ස්ථානයට යාබදව කළු ගල් වලක් (quarry) පවත්වාගෙන යන බවත්;

(ii) ඒ හේතුවෙන් මෙම පූජා භූමිය ආශ්‍රිතව විශාල පරිසර හානියක් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගල්වල පවත්වාගෙන යෑම සඳහා අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, සංස්කෘතික වටිනාකමකින් යුත් ඉහත ස්ථානයේ සිදුවන පරිසර හානියට වගකිවයුත්තෝ කවුරුන්ද;

(iii) එම පරිසර හානිය වළක්වා ගැනීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සංගණන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

විදුලි සංදේශ බදු පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

හරබදු (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 මාර්තු මස 22 වැනි අඟහරුවාදා)**

0664/'10

ගරු අනුර දිසානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආරම්භයේදී, වී අලෙවි මණ්ඩලය සතුව තිබූ,

(i) ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ගබඩාව පිහිටි ස්ථාන කවරේද;

(iii) එම ගබඩාවල ධාරිතාව වෙන වෙනම කොපමණද;

(iv) එක් එක් ගබඩාවේ සේවය කළ සේවක සංඛ්‍යාව කොපමණද;

(v) වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අද වන විට රජය සතු,

(i) වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) වී ගබඩා පිහිටි ස්ථාන කවරේද;

(iii) එක් එක් ගබඩාවේ ධාරිතාව හා සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වී මිළදී ගැනීම සඳහා වෙන් කළ වාහන වර්ග සහ සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ 5 තුළ,

(i) යල හා මහ කන්නවලදී එක් එක් ගබඩාව මිලදී ගත් වී ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වී ගැණුම් මිල කොපමණද;

(iii) වී විකුණුම් මිල කොපමණද;

(iv) ඉහත කාල සීමාව තුළ මිලදීගත් වී තොගවලින් විනාශ වූ වී ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0665/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ 10 තුළ, යල සහ මහ කන්නවලදී, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) කෘෂිකාර්මික භෝග වගාකළ හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(ii) එක් එක් අපනයන භෝග වගා කළ හෙක්ටයාර් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අපනයන භෝග වගාකළ හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 10 තුළ, එක් එක් වර්ෂයේ,

(i) වගාකරන ලද එක් එක් කෘෂිකාර්මික භෝගවලින් ලද අස්වැන්න කන්න අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් අපනයන භෝගයේ වාර්ෂික අස්වැන්න සහ එම භෝගයන්හි අපනයන වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම භෝගවල සමස්ත අපනයන වටිනාකම කොපමණද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0666/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 1977 වන විට තිබූ රජයේ ගොවිපලවල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම එක් එක් ගොවිපලේ,

(i) නම, ගොවිපල පිහිටුවීමේ අරමුණ සහ කරන ලද කාර්යභාරය කවරේද;

(ii) විශාලත්වය හා සේවය කළ සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) ලාභ ලැබූ වර්ෂ, ලැබූ ලාභය, ලාභ ලැබූ අංශ හා ලාභ ලැබූ වර්ෂ කීපයක නිෂ්පාදන ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ගොවිපලවල් අතරින් පෞද්ගලික අංශයට පැවරූ ගොවිපලවල් කවරේද;

(ii) ඒවා පවරන ලද පුද්ගලයින් හා වර්තමාන හිමිකරුවන් කවුරුන්ද;

(iii) එම පැවරීම් කළ දිනයන්, මිල ගණන් හා පැවරුමේ මූලික කොන්දේසි කවරේද;

(iv) දැනට පෞද්ගලික ගොවිපලවලින් ඉටු කෙරෙන කාර්යයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දැනට රජය සතු ගොවිපල්වල,

(i) ඉටු කෙරෙන කාර්යයන් කවරේද;

(ii) සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ පහ තුළ ලැබූ ලාභ හෝ අලාභ ප්‍රමාණ කවරේද;

(iv) පසුගිය වර්ෂයේ නිපැයූ එක් එක් නිෂ්පාදනයන්හි අගයයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0667/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දැනට කෘෂිකර්මාන්තයට අදාළව මධ්‍යම ආණ්ඩුවේ හා පළාත් සභා තුළ පිහිටුවා ඇති රාජ්‍ය ආයතන (දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, අධිකාරි) කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් ආයතනය,

(i) පිහිටුවූ දිනයන්, පිහිටුවීමේ අරමුණු සහ ඉටු කරනු ලබන කාර්යය;

(ii) පිහිටුවා ඇති තනතුරු හා ඒ ඒ තනතුරේ අද වන විට සිටින සේවක සංඛ්‍යාව;

(iii) ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන ආකාරය සහ ඒවායේ සංවිධාන ව්‍යුහය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අද වන විට කෘෂිකර්මාන්තයට අදාළව පිහිටුවා ඇති රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) එම එක් එක් ආයතනය පිහිටු වූ අය සහ ඒවාට ප්‍රතිපාදන ලබා දෙන අය කවුරුන්ද:

(iii) මේ වන විට එම සංවිධාන මගින් වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කවරේද;

(iv) එම එක් එක් ආයතනයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0669/'10

ගරු අනුර දිසානායක මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මහා වාරිමාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වාරිමාර්ගය අයත් ආසනය කුමක්ද;

(iii) එම එක් එක් වාරිමාර්ගයේ නම සහ ජල මූලාශ්‍රය කවරේද;

(iv) ජල පෝෂිත ප්‍රමාණය සහ එහි ධාරිතාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත එක් එක් වාරිමාර්ගය,

(i) ඉදිකිරීම් ආරම්භ කළ වර්ෂය;

(ii) අවසන් කළ වර්ෂය;

(iii) ජනතා අයිතියට පැවරූ දිනය;

(iv) නිමකිරීම සඳහා වැය කළ මුදල;

කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ 20 තුළ, එම එක් එක් වාරිමාර්ගය වෙනුවෙන්,

(i) ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) මුදල් වෙන් කළ වර්ෂයන් කවරේද;

(iii) ඉටු කරන ලද කාර්යය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ඉහත එක් එක් වාරිමාර්ගයට අදාළව,

(i) අස්වද්දන ලද ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) පසුගිය වර්ෂ දහය තුළ යල සහ මහ කන්නවල වෙන් වෙන් වශයෙන් වගා කළ ඉඩම් ප්‍රමාණය;

(iii) පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0776/'10

ගරු අජිත් කුමාර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුහුණු විශ්වවිද්‍යාලයේ ආචාර්ය දර්ශන වික්‍රමසිංහ මහතාට එරෙහිව ගොනු කොට තිබූ සියලු චෝදනාවලට නිවැරදිකරු බව සනාථ වී තිබුණ ද විශ්වවිද්‍යාල සභාවෙන් ගත් තීරණයකට අනුව එතුමා සේවයෙන් පහ කොට ඇති බවත්;

(ii) ආචාර්ය වික්‍රමසිංහ මහතා විසින් ඉහත තීරණය අභියාචනාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කළ අතර, එම තීරණය අවලංගු කරමින් සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කර ඇති බවත්;

(iii) තම රැකියාව අහිමි වීමට හේතු වූ ද්වේෂ සහගත චෝදනා ඉදිරිපත් කරමින් එම විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මිරානි වීරසූරිය තමන්ට සිදු කළ හානි පිළිබඳව ආචාර්ය වික්‍රමසිංහ මහතා මාතර දිස්ත්‍රික් උසාවියේ පෞද්ගලික පැමිණිල්ලක් කර ඇති බවත්; සහ

(iv) මෙම පෞද්ගලික නඩුවේදී පවා මහාචාර්ය වීරසූරිය සඳහා සේවය ලබාදෙන නීතිඥවරුන් වෙනුවෙන් විශ්වවිද්‍යාලය ගෙවීම් සිදුකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රුහුණු විශ්වවිද්‍යාලයේ බලධාරීන් ගන්නා ඉහත ක්‍රියාමාර්ග සාධාරණීකරණය කළ හැකිද යන්න; සහ

(ii) ඉහත කාරණය පිළිබඳව විමසා බැලීමට විශ්වවිද්‍යාල කොමිෂන් සභාවට උපදෙස් දුන්නේද යන්නත්; අනාගතයේදී මෙවන් සිදුවීම් වැළැක්වීමට යෝග්‍ය පියවර ගන්නේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0777/'10

ගරු අජිත් කුමාර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයට 2004, 2005, 2006, 2007, 2008 සහ 2009 යන වර්ෂ සඳහා ලැබුණු විදේශ පර්යේෂණ සඳහා වූ ප්‍රදානයන්හි වටිනාකම් සහ ඒවා ලැබුණු මූලාශ්‍ර වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම වෛද්‍ය විද්‍යා පීඨය විසින් එම අරමුදල් උපයෝජනය කළ ආකාරය කවරේද;

(iii) මෙම ආධාර ලැබීම් සම්බන්ධව සහ මෙම ආධාර භාවිතා කරමින් කරන ලද පර්යේෂණවල සොයාගැනීම් පිළිබඳව වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ සභාව, සනාථන සභාව සහ අධ්‍යයන අධිකාරිය දැනුවත් කරන ලද්දේද;

(iv) නොඑසේ නම්, අදාළ අධිකාරීන් දැනුවත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 1978 අංක 160 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) වගන්තිය අනුව සහ රජයේ අනෙකුත් මූල්‍ය රෙගුලාසිවලට අනුව මෙම අරමුදල් විශ්වවිද්‍යාලයේ ගිණුම්වල ඇතුළත් කරන ලද්දේද;

(ii) නොඑසේ නම්, ගිණුම්ගත නොකිරීමට හේතුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 මාර්තු මස 23 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0041/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපතිවරුන් වන ගරු ජෝන් අමරතුංග, ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ සහ ගරු රෝහිත බෝගොල්ලාගම යන මහත්වරුන් විසින් ඉදිරිපත් කරන ලද කෝප් (COPE) වාර්තා සහ 2007 ජනවාරි 12 වැනි දින ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු විගණකාධිපති මායාදුන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද 2006 ජූලි 20 වැනි දිනැති වාර්තාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු රවුෆ් හකීම් මහතා විසින් 2007 නොවැම්බර් 29 වැනි දින ඉදිරිපත් කරන ලද අංක PS12 දරන වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත වාර්තාවලට අනුව විමර්ශනය කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) කාරක සභා වාර්තාවේ සඳහන් උපදෙස් අනුව ආරම්භ කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0239/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, සූරියවැව කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0700/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධිකරණ අමාත්‍යාංශය යටතට එන නීති සහ රෙගුලාසි සඳහා කළ යුතු වෙනස්කම් නිර්දේශ කිරීම සඳහා එතුමාට පෙර එම නිලය දැරූ අමාත්‍යතුමා විසින් පත් කරන ලද කාරක සභා සංඛ්‍යාව කවරේද;

(ii) එම කාරක සභා විසින් සලකා බලන ලද අංශ කවරේද; සහ

(iii) අමාත්‍යාංශයට වාර්තා ඉදිරිපත් කර ඇති කාරක සභා සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වාර්තා ඉදිරිපත් කර නොමැති කවර හෝ කාරක සභාවල වාර්තා කඩිනමින් ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) (i) කඩිනම් තීන්දු ලබාදීම ධෛර්යමත් කරන සහ යුක්තිය පසිඳලීම පමා කිරීම සඳහා වන දින ඉල්ලීම් සහ ඒ සඳහා වන එකඟත්වයන් අධෛර්යයට පත් කරන කාර්ය සාධන දර්ශක විනිශ්චයකාරවරුන් සහ මහේස්ත්‍රාත්වරුන් සඳහා ස්ථාපිත කිරීම;

(ii) සිර මැදිරිවල තදබදය සහ තරුණ පුද්ගලයන් සඳහා ලබාදෙන යෝග්‍ය නොවන දඬුවම් අඩු කිරීම සඳහා වැඩි අවබෝධයක් සහිත දඬුවම් දීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම;

(iii) ගැටුම් සඳහා අධිකරණ ක්‍රියාමාර්ගවලින් පිහිට සෙවීම අඩු කිරීම සඳහා බේරුම්කරණයට සහ සමාදාන කිරීමට අදාළ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම; සහ

(iv) දඬුවම් ලබාදීම සිදු කරන්නේ අඩපාඩු සකස් කිරීමේ සහ වැළැක්වීමේ සාධකයක් ලෙස විනා පළිගැනීම අරමුණු කරගෙන නොවන බව තහවුරු කරමින් විනිශ්චයකාරවරුන්ට, මහේස්ත්‍රාත්වරුන්ට සහ පොලිස් නිලධාරීන්ට පුහුණුව ලබා දීම;

ඉහත සඳහන් වාර්තා අතරින් කිසියම් වාර්තාවක් මගින් හෝ නිර්දේශ කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එසේ නම්, එම වාර්තා පදනම් කරගෙන එතුමා පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, මෙම අරමුණු සාර්ථක කර ගැනීම සඳහා එතුමා වෙනත් පියවර ගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0714/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වරාය අධිකාරියේ වත්මන් සභාපතිවරයාගේ සම්පූර්ණ නම සහ වයස කවරේද;

(ii) එම තනතුරට ඔහු පත් කළ බලධාරියා කවරෙක්ද;

(iii) එම සභාපතිවරයා මෙයට පෙර සේවය කළ ස්ථානය සහ තනතුර කවරේද;

(iv) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද කවරේද;

(v) ඔහුගේ මාසික වැටුප සහ ලැබෙන වෙනත් දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0869/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන්;

(i) ජාතික වශයෙන් සමත්වීමේ ප්‍රතිශතය කොපමණද;

(ii) එක් එක් පළාතේ සමත්වීමේ ප්‍රතිශත, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැඩිම සමත් ප්‍රතිශතය හිමි කර ගත් අධ්‍යාපන කලාප 3 හා එම එක් එක් අධ්‍යාපන කලාපයේ සමත් ප්‍රතිශත කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මෙම ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්වීමේ ප්‍රතිශතය වර්ධනය කිරීම සඳහා එතුමා අවශ්‍ය පියවර ගන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0884/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් "ස්ටෝනි ක්ලිෆ්ට්" වතුයායේ "රෝසිටා" කොටසේ නිවාස හැට හයක් (66) සාදා ඇති බවත්;

(ii) එම නිවාස අතුරෙන් නිවාස තිස් තුනක් (33) සේවක නිවාස වශයෙන් වෙන්කර දී ඇති බවත්; ඉතිරි නිවාසවල තවමත් කිසිවකු පදිංචි නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉතිරි නිවාසද පදිංචිය සඳහා සේවකයන්හට වෙන්කර දීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0900/'10

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව ප්‍රාග්ධන සමූපකාර සමිතියේ (ඌව ප්‍රාග්ධන සමූපකාර බැංකුව) අධ්‍යක්ෂ මණ්ඩලය සමූපකාර පනතට අනුව පත් කර තිබේද;

(ii) එම අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීමේදී නීත්‍යානුකූලව කාරකසභා හා මහසභා රැස්වීම් පවත්වා තිබේද;

(iii) මෙම සමූපකාර සමිතියේ මහසභා රැස්වීම් පැවති ස්ථානය සහ දිනය කවරේද;

(iv) මෙම සමූපකාර සමිතියේ සිටින සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඌව ප්‍රාග්ධන සමූපකාර සමිතියේ වත්මන් සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් කවරේද;

(ii) එහි සාමාන්‍යාධිකාරිවරයාගේ සහ විධායක නිලධාරීන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම සමූපකාර සමිති බැංකුවේ හිටපු සභාපතිවරයා හා වත්මන් සභාපතිවරයා සහෝදරයන් බවත්;

(ii) මෙහි සාමාන්‍යාධිකාරිවරිය හිටපු සභාපතිවරයාගේ භාර්යාව බවත්;

(iii) මෙහි සිදුවී ඇති දූෂණ හා වංචාවන් පිළිබඳ විගණන වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) ඉහත (ඇ) (iii) හි සඳහන් විගණන වාර්තාව අනුව නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0905/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වසර පහකට අධික කාලයක් නැගෙනහිර පළාතේ කොන්ත්‍රාත් පදනම යටතේ අඛණ්ඩව සේවයකරමින් සිටි ඉංග්‍රීසි ගුරුවරුන් පිරිසක් සඳහා අදියර දෙකකින් (රා.ප.වක්‍රලේඛ අංක 13/2005 සහ 21/2006 යටතේ) ස්ථිර පත්වීම් පිරිනමන ලද බවත්;

(ii) ඉහත රා.ප. වක්‍රලේඛවලට අනුව, අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්ගේ ED/2/29/4/1/46 හා 2005/7/19 දිනැති ලිපියේ සඳහන් උපදෙස් පරිදි, 2005/7/28 දින සිට ඉහත ගුරු පිරිසෙන් කොටසකට පත්වීම් ලබාදී ඇති නමුත්, 2003 - 2004 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම යටතේ අඛණ්ඩව සේවය කරන 50 දෙනෙකු පමණ ගුරු පිරිසකට මේ දක්වා ස්ථිර පත්වීම් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර, අක්කරපත්තුව සහ සම්මන්තුරේ යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සේවයේ නියුතු එවැනි ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබා දීමටත්;

(ii) මඩකලපුව දිස්ත්‍රික්කයේ පඩ්ඩිරිප්පු, කල්කුඩා සහ මඩකලපු යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සේවයේ නියුතු එවැනි ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබාදීමටත්;

නොපමාව පියවර ගන්නේද, යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0250/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0646/'10

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග පුළුල් කිරීම සහ සංවර්ධනය වැනි කටයුතු සඳහා රජය විසින් පවරාගත්, එහෙත් ඒ සඳහා තවමත් වන්දි ගෙවීමක් සිදු කර නොමැති ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ගෙවිය යුතු මුදල කොපමණද;

(iii) එම වන්දි ගෙවීම් සිදුකළ යුත්තේ කවර දිනයක සිටද;

(iv) පවරාගත් ඉඩමේ හිමිකරුවන්ට මෙතෙක් නොගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය සඳහා පොළියක් ගෙවනු ලබන්නේද;

(v) බහුතරයකට මුදල් නොගෙවා තිබියදී ඇතැම් ආයතනවලට සහ පුද්ගලයින්ට පමණක් මුදල් ගෙවනු ලැබීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉඩම් පවරාගැනීම සිදුකළ යුත්තේ ඒ සඳහා නියමිත සම්පූර්ණ වන්දි ප්‍රමාණය ගෙවීමෙන් පසුව බව පැවසීමට අයිතියක් අනාගතයේදී පුරවැසියන්ට හිමිවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0841/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 වර්ෂයේ සිට මේ දක්වා රජයට අහිමි වී ඇති මුළු තීරුබදු ආදායම් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2009 වර්ෂයේදී වෙළඳ ගිවිසුම් හතරකින් පමණක් රජයට අහිමි වූ තීරුබදු ආදායම රුපියල් කෝටි 600කට ආසන්න බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් නිසා තීරු බදු ආදායම අඩුවීමට හේතු වූ කාරණා කවරේද;

(iii) එම තත්ත්වයන් මග හරවා ගැනීමට රජය ගන්නා වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0872/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයෙන් පසු අප රට තුළ ජාතික විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීමට අවශ්‍ය විදුලිය ජනනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක වූ බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘති, ජල විදුලි බලාගාර, තාප විදුලි බලාගාර හා වෙනත් බලාගාර වශයෙන් වෙන් වෙන්ව කවරේද;

(iii) එම ව්‍යාපෘති මගින් ජාතික විදුලිබල පද්ධතියට මේ වන විට දායක කර ගත් මෙගා වොට් ප්‍රමාණය සහ ඉදිරියේදී එක් කිරීමට ඉලක්ක කර ඇති මෙගා වොට් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිවලට අමතරව තවත් විශේෂ ව්‍යාපෘති ආරම්භ කිරීම කෙරෙහි අවධානය යොමු කර තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් ව්‍යාපෘතිය පිළිබඳ විස්තර සැකෙවින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0901/'10

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කය හරහා ගලාබසින කුඹුක්කන් ඔය හරස් කර, මොනරාගල - බිබිල පාරේ, හොරගොල්ල ප්‍රදේශයේ ජලාශයක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(ii) එහි ඉදිකිරීම් ආරම්භ කිරීමට නියමිත දින වකවානු කවරේද;

(iii) එම ජලය මොණරාගල දිස්ත්‍රික්කයෙන් පිටතට ගෙනයාමට සැලසුම් කර තිබේද;

(iv) එසේ නොමැති නම්, එමගින් ජලය ලබා දෙන මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රදේශය කවරේද;

(v) මෙම ජලාශය ඉදිකිරීමේදී ඊට යටවන ඉඩම් සඳහා විකල්ප ලබා දීමටත්, ඉඩම් හා දේපල වෙනුවෙන් වන්දි ලබා දීමටත් කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0915/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අවසන්වරට ඡන්දයෙන් නිලධාරීන් තෝරාගනු ලැබූ වර්ෂය කවරේද;

(ii) එම අවස්ථාවේ එහි සභාපති ධුරයට පත්වූයේ කවුරුන්ද;

(iii) වර්ෂ 2005 මාර්තු, 2008 දෙසැම්බර්, 2009 මාර්තු සහ 2010 ජූලි යන අවස්ථාවන්හිදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අතුරු කමිටු පත්කිරීමට හේතු වූ කරුණු එක් එක් අවස්ථාවට අදාළව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් අවස්ථාවේ පත් කළ අතුරු කමිටුවල සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 33 වැනි වගන්තිය ප්‍රකාරව "අතුරු කමිටු" පත්කරනු ලබන අවස්ථා කවරේද;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට 2005 වර්ෂයේ සිට මේ දක්වා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නිලධාරීන් තෝරා ගැනීමට තිබූ බාධා කවරේද;

(iii) එම ආයතනයට ප්‍රජාතන්ත්‍රවාදීව නිලධාරීන් තෝරා නොගැනීම ක්‍රිකට් ක්‍රීඩාවේ පැවැත්මට නුසුදුසු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ක්‍රීඩා පනතේ 35 වැනි වගන්තිය අනුව ක්‍රීඩා සමාජවල ඡන්දයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට නිලධාරීන් තෝරා ගැනීම සඳහා කවර දිනයක කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0977/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අඩු පහසුකම් සහිත පාසල් ලෙස හඳුනාගෙන තිබෙන පළාත් සභා සහ මධ්‍යම රජය යටතේ පවතින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතුරින් මුස්ලිම් පාසල් හා වතු පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාසල්වල දියුණුව උදෙසා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන වැඩ සටහන් දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 මාර්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0226/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌනතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0384/'10

ගරු රවි කරුණානායක මහතා,— වරාය සහ මහා මාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ගාලු මුව දොර සිට වැල්ලවත්ත දක්වා මුහුදු ප්‍රදේශය තුළ අක්කර 500 ක් ගොඩ කරනු පිණිස ශක්‍යතා අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතින බව සත්‍යයක් දැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ශක්‍යතා අධ්‍යයනය සිදු කරන්නේ කවරෙක්ද;

(ii) මුහුදු පතුල පිරවීමට යන වියදම කොපමණද;

(iii) එයින් පරිසරයට බලපෑම් ඇති කෙරෙන්නේද;

(iv) මෙම ව්‍යාපෘතියේ දේශීය හා විදේශීය විශේෂඥ උපදේශකවරු සහ අයෝජකයෝ යන පාර්ශ්ව කවරේද;

(v) එබඳු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථය කුමක්ද;

(vi) ඒ සඳහා වැයකරනු ලබන මුදල ආපසු ගෙවිය යුතු කාලසීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0528/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නැගෙනහිර පළාතේ ඇතුළත වටරවුම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ අධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0621/'10

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 2008/41 මගින් පාසල් ආදී ශිෂ්‍ය සංගම් හා වෙනත් විවිධ සංගම් මගින් පාසල් සිසුන්ගෙන් සහ දෙමාපියන්ගෙන් යම් යම් හේතු දක්වා මුදල් එකතු කිරීම තහනම් කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ තිබියදී කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය 2010 රෝයල් පැරේඩ් (Royal Parade) නමින් රු. 600 ක් වටිනා කොටු කාඩ්පත් ළමුන් අතර බෙදා එමගින් මුදල් එකතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) උක්ත චක්‍රලේඛයට පටහැනිව මුදල් එකතු කර තිබේ නම්, ඒ වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0761/'10

ගරු තිස්ස අත්තනායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්‍ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් VOIP අන්තර්ජාතික දුරකථන සේවාවන් සම්බන්ධයෙන් ටෙලිකොම් ඒෂියා සමාගම සමග ගිවිසුමකට එළඹුනේද;

(ii) ඒ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමතිය ලැබුනේද;

(iii) එම ගිවිසුමට එළඹීමට පෙර අන්තර්ජාතික දුරකථන ඇමතුම් වෙනුවෙන් විනාඩියකට ඇමරිකානු ඩොලර් (US$) 0.075ක මුදලක් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට ලැබුනේද;

(iv) එම ගිවිසුම නිසා ඉහත මුදල විනාඩියකට ඇමරිකානු ඩොලර් (US$) 0.069 දක්වා අඩු වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම සමඟ ගිවිසුමට එළඹෙන ලෙස වර්ෂ 2009 සැප්තැම්බර් මස දී මුල්වරට යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවේද;

(ii) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය එම යෝජනාව නීතිමය හා මූල්‍යමය කරුණු මත ප්‍රතික්ෂේප කළේද;

(iii) එසේ නම්, එම සමාගම ශ්‍රී ලංකාවට නැවත ගෙන්වනු ලැබුවේ කවුරුන්ද;

(iv) එම ගිවිසුම අත්සන් කර ඇත්තේ අදාළ සාමාන්‍ය කාර්ය පටිපාටියට පටහැනිවද;

(v) එම ගිවිසුම අත්සන් කිරීමෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට සිදුවන අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0870/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ තරුණ තරුණියන් ජාතික තරුණ සේවා සභාවට සම්බන්ධ කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේද;

(ii) එම පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති යෞවන සමාජ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු පළාතේ තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එම පළාත තුළ පිහිටුවා ඇති වෘත්තීය පුහුණු ආයතන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) එම ආයතනවල ක්‍රියාත්මක වෘත්තීය පුහුණු පාඨමාලා කවරේද;

(iv) ඒ සඳහා තරුණ තරුණියන් ප්‍රමාණවත් පිරිසක් සහභාගී වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0902/'10

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව ප්‍රාග්ධන සමූපකාර සමිතියට අනුබද්ධ බැංකුවේ ආරම්භ කර ඇති ළමා ඉතිරි කිරීම් ගිණුම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගිණුම් හිමියන්ගේ නම් කවරේද;

(iii) මෙම බැංකුවේ තැන්පත් කරන මුදල්වලින් බැංකුවේ නිලධාරීන්ට හා වෙනත් පුද්ගලයින්ට ණය මුදල් ලබාදී තිබේද;

(iv) එසේ නම්, ණය ලබා දී ඇති අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එලෙස ලබාගත් ණය මුදල් ආපසු ගෙවීම පැහැර හැර ඇති බවත්;

(ii) ගෙවීම් පැහැර හැර ඇති අය සම්බන්ධව එම බැංකුව මගින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම ණය ගෙවීම් පැහැර හැර ඇති අයගේ නම් කවරේද;

(ii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0923/'10

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැයෙන් දේශීය හා විදේශීය වශයෙන් සපුරා ගන්නා ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0978/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ මහ නගර සභාවේ සහකාර වැද්දුම්කරු තනතුර දරමින් සිටියදී, වර්ෂ 2008-11-20 දින විශ්‍රාම ගිය ඒ. එච්. එම්. මහ්රූෆ් මහතාට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ලබාදෙන ප්‍රදානයන් සහ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් (HRC/2505/05/ හා 2007-06-14 දින) ලබා දී ඇති නියෝග අනුව, වර්ෂ 1989-4-27 දින සිට සහකාර වැද්දුම්කරු තනතුරේ ස්ථිර සේවකයෙකු ලෙස හා 1989 සිට පුහුණු I පන්තියේ II ශ්‍රේණියේ වැද්දුම්කරු තනතුරට උසස්වීම් ලද අයෙකු ලෙස සැලකිය යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, එම කරුණු සලකමින් මහරුප් මහතාගේ විශ්‍රාම වැටුප සහ ඊට අදාළව හිමිවිය යුතු සියලු දීමනා සකසා නොපමාව ලබාදීමට පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0240/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) මෙම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0647/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 ජනවාරි - මැයි කාලසීමාව තුළ රටේ සැබෑ විදේශ විනිමය හිඟයක් පැවති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) විදේශ විනිමය ආකර්ශණය කර ගැනීමේ අරමුණින් මහ බැංකුව විසින් ඉදිරිපත් කර තිබෙන විවිධ වූ යෝජනා ක්‍රමයන්හි නම් කවරේද;

(ii) තව දුරටත් පවතින එවැනි යෝජනා ක්‍රම කවරේද;

(iii) අනේවාසික විදේශ මුදල් ගිණුම් හිමියන්ට 20%ක විශේෂ ගෙවීමක් කරනු ලැබුවේද සහ එය තවමත් ක්‍රියාත්මකද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) (i) ඉතුරුම් දිරිගැන්වීම සඳහා 2009 අය-වැය තුළින් සහ 2009 වසර මැදදී ඉදිරිපත් කර ඇති යෝජනා ක්‍රම කවරේද;

(ii) ඒ වන විට ලබාදුන් පොළී අනුපාතය සහ අද පවතින පොළී අනුපාතය කවරේද;

(iii) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඉතුරුම් ගිණුම් සඳහා 20% ක ප්‍රසාද දීමනාවක් ලබා දුන්නේද;

(iv) එසේ නම්, එය ක්‍රියාත්මක වූයේ කවර දිනයක් දක්වාද;

(v) දැන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ආධාර ලබාදෙන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0842/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 එක්සත් ජාතීන්ගේ සමුළුව සඳහා සහභාගී වූ ජනාධිපතිවරයා ඇතුළු කණ්ඩායමේ සිටි සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමුළුව සඳහා එක් රටකට ලැබෙන නිල අවසර පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම කණ්ඩායම නවාතැන් ගත් ස්ථානයේ නම කුමක්ද;

(iv) එම සංචාරය වෙනුවෙන් වියදම් වූ මුළු මුදල කොපමණද;

(v) එම වියදම දරනු ලබන අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සමුළුවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික අනෙකුත් රටවල්වලින් ඉදිරිපත් කළ නියෝජිත සංඛ්‍යාව එක් එක් රට අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0871/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අප රටේ පුරවැසියන් වෙනුවෙන් වැඩිහිටි සංවිධාන පිහිටුවා ඇති බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, දැනට රට තුළ පිහිටුවා ඇති වැඩිහිටි සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්හට වැඩිහිටි හැඳුනුම්පතක් ලබාදීමට කටයුතු කර තිබේද;

(iv) එම හැඳුනුම්පත සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම පිළිගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0924/'10

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු තාප විදුලි බලාගාර ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැයෙන් දේශීය හා විදේශීය වශයෙන් සපුරාගන්නා ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන්;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබෙන මාර්ග;

(iii) සම්පූර්ණ පිරිවැය ප්‍රමාණයෙන් ණය මුදල් වශයෙන් ලැබෙන ප්‍රමාණය;

(iv) ණය මුදල් ප්‍රදානය කරනු ලබන රටවල්;

(v) එම ණය මුදල් වෙනුවෙන් ගෙවිය යුතු පොලී ප්‍රමාණය සහ ණය මුදල් පියවීමේ කාල සීමාව;

(vi) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාල සීමාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමවේදය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0979/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, නීතිමය පදනමක් යටතේ ස්ථාපිත ආයතනයක් බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 1996 අංක 21 දරන පනත යටතේ පිහිටුවන ලද එම කොමිෂන් සභාව, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු වෙනත් රාජ්‍ය ආයතන මඟින් සිදුකොට ඇති මානව හිමිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳව පුරවැසියන් විසින් කරනු ලබන පැමිණිලි විමර්ශනය කොට නිකුත් කරන නිර්දේශයන් හෝ නියමයන් ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතනයන් බැඳී සිටීද;

(ii) එම කොමිෂන් සභාවේ නිර්දේශයන් හෝ නියමයන් ක්‍රියාත්මක කළ යුතු බවට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් නිකුත්කොට තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත අ(ii) හි පරිදි චක්‍රලේඛයක් නිකුත් කොට නොමැති නම්, එවැනි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් නිකුත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 මාර්තු මස 25 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0227/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අඟුණුකොළපැලැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌනතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0430/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයට අයත් සංස්ථා, මණ්ඩල යනාදී ආයතන සඳහා අද වන විට ආයෝජනය කර ඇති ප්‍රාග්ධන ප්‍රමාණය සඳහන් කරමින්, එම සියලු ආයතනවල නම් කවරේද;

(ii) පසුගිය වර්ෂ තුනක කාලය තුළදී එකී ආයතනවල සේවය කළ පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජය සතු කොටස් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත (අ) (i) හි සඳහන් ආයතනවල පසුගිය වර්ෂය සඳහා එක් එක් ආයතනයේ ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) (අ) (i) හි සඳහන් මුළු ආයතන සංඛ්‍යාවෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා නොකරන සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ වාර්තා නොකිරීමට හේතුව කවරේද;

(iii) එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තිය උල්ලංඝනය කිරීමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0534/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, අක්කරපත්තු - සකාමම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0706/'10

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වර්ෂ 2005 සිට 2009 දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට හිමිකම් ලබමින් සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ හිමිකම් ලද අයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) 2005, 2006, 2007, 2008 සහ 2009 වර්ෂවල සමෘද්ධිලාභීන්ට වාර්ෂිකව ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් වර්ෂය තුළ සමෘද්ධිලාභීන් වශයෙන් සිට එහෙත්, පසුව ඉවත් කරන ලද සංඛ්‍යාව, එම අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එසේ ඉවත් කරන ලද පදනම කවරේද;

(iii) එම කාල සීමාවේදී අලුතින් එක් වූ සමෘද්ධිලාභීන් සිටී නම්, ඔවුන්ට ගෙවූ මුදල් ප්‍රමාණය සහ ඔවුන්ගේ ලිපිනයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0782/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ පදිංචි උපතින්ම ආබාධිත සහ විවිධ අනතුරු හා රෝගාබාධවලට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව සිටින පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආබාධිත පුද්ගලයන් සඳහා රජය මගින් සලසනු ලබන සහන සේවාවන් කවරේද;

(iii) ඒ සඳහා රජය වාර්ෂිකව වැය කරන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0893/'10

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින ප්‍රධාන පාසල්වල සිසු දරුවන්ට අධ්‍යයන නිවාඩු (study leave) නමින් නිවාඩු ලබාදෙන බවත්;

(ii) අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට වාර අවසානය වන විට විෂය නිර්දේශයට අයත් පාඩම් මාලා අවසන් කළයුතු වුවත්, අදාළ විෂය භාර ගුරුවරුන් විසින් පාසල් කාල සීමාව තුළදීම උපකාරක පන්ති (Tuition classes) පවත්වන බවත්;

(iii) එම පන්ති පැවැත්වීම සඳහා ඉහත සඳහන් කළ පරිදි 'අධ්‍යයන නිවාඩු' ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත පරිදි නිවාඩු ලබාදීමට අනුමත කර ඇත්තේ කවුරුන් විසින්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 'අධ්‍යයන නිවාඩු' ලබාදෙමින් පාසල් කාල සීමා තුළ පන්ති නොපවත්වා එකී කාල සීමාව තුළම මුදලට අමතර පන්ති පවත්වන රජයේ පාසල් ගුරුවරුන් පිළිබඳව සොයා බලා ඔවුන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0906/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය කලාප අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි දෙදහසකට අධික ශිෂ්‍යයින් සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන අල්-අක්ෂා ජාතික පාසලේ මේ වන විට විවිධ විෂයයන්ට අදාළව විසිදෙනෙකුටත් වැඩි ගුරු හිඟයක් සහ භෞතික සම්පත් හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසලේ පවතින උග්‍ර ගුරු හිඟය පියවීමටත්, ශ්‍රවණාගාර පහසුකම් ඇතුළු අවශ්‍ය භෞතික සම්පත් ලබාදීමටත් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0926/'10

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ වරායේ නව කන්ටේනර් පර්යන්ත ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැය;

(ii) එම සම්පූර්ණ පිරිවැයෙන් දේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iii) විදේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iv) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබෙන මාර්ග;

(v) සම්පූර්ණ පිරිවැයෙන් ණය වශයෙන් ලැබෙන ප්‍රමාණය;

(vi) ණය මුදල් ප්‍රදානය කරනු ලබන රටවල්, අදාළ පොලී ප්‍රමාණයන් සහ ණය පියවීමේ කාල සීමාවන්;

(vii) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාල සීමාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0972/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේදී පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේ පැවැත්වීමට සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එහි සංවිධාන කටයුතුවලට අමතරව එම උළෙල සඳහා වූ ජාතික වැඩ පිළිවෙළක් සකසා තිබේද;

(iii) පාසල්වල දක්ෂතා ඇති ක්‍රීඩකයින් හඳුනාගැනීමට වැඩ පිළිවෙළක් සකසා තිබේද;

(iv) ගම්බද ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික මට්ටමට ගෙන ඒමට වැඩසටහනක් සකසා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0980/'10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ සිට සෞදි අරාබියාවේ ගෘහ සේවිකාවක් ලෙස සේවයට ගිය, රිසානා නෆීක් මෙනෙවියට එරට අධිකරණය මගින් මරණ දඬුවම් නියම කොට ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රිසානා නෆීක් මෙනෙවිය ශ්‍රී ලංකාවේ සිට ගෘහ සේවිකාවක් ලෙස පිටත්ව ගිය දිනය, ඇයගේ ගමන් බලපත්‍ර අංකය, එහි සඳහන් උපන් දිනය සහ එය නිකුත් කළ දිනය කවරේද;

(ii) ඇයගේ ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර අයදුම්පත සහතික කරන ලද සාම විනිසුරුවරයාගේ නම සහ ලිපිනය කවරේද;

(iii) රිසානා මෙනෙවියගේ උප්පැන්න සහතිකයේ සඳහන් උපන් දිනය, ලියාපදිංචි අංකය හා දිනය සහ ලියාපදිංචි බල ප්‍රදේශය කවරේද;

(iv) ඇයගේ ජාතික හැඳුනුම්පතේ සඳහන් උපන් දිනය හා ජාතික හැඳුනුම්පතේ අංකය කවරේද;

(v) රිසානා මෙනවියට විදේශගතවීමට සහායවූ විදේශ රැකියා නියෝජිත ආයතනයේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඇයට සෞදි අරාබියාවේ අධිකරණය විසින් මරණ දඬුවම නියම කළ දිනය හා අභියාචනාධිකරණයේ තීන්දුව ප්‍රකාශ කළ දිනය කවරේද යන්න එතුමා දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0241/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිස්සමහාරාම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0447/'10

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර දහයක කාලය තුළ, එක් එක් වර්ෂයේ දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හැරගිය සේවකයන් සඳහා ගෙවූ සම්පූර්ණ පාරිතෝෂික ප්‍රමාණය කොපමණද;

(ii) එම සේවකයන්ගේ නම් සහ 2005 සිට 2010 දක්වා එක් එක් වර්ෂයේ දී, එම එක් එක් සේවකයාට ගෙවූ පාරිතෝෂික ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හැරගිය මීතොටමුල්ල ඩිපෝවේ ඩබ්ලිව්. ඒ. ජයසේන මහතා ඇතුළු සේවකයන් කිහිප දෙනෙකුට තවමත් පාරිතෝෂික නොගෙවීමට හේතුව කවරේද;

(ii) ඔවුන්ට පාරිතෝෂික ගෙවීම සඳහා ලබාදුන් මුදල් දැනට තිබෙන ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0862/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොත් ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය නොහොත් ලේඛකාධාර ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) ආරම්භයේ සිට අද දක්වා එම ව්‍යාපෘතිය සඳහා එක් එක් වර්ෂය සඳහා රජයෙන් වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ ආධාර ලබාගත් ලේඛකයින්ගේ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ දී එම ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය කවරේද;

(ii) ලේඛකයින්ට මහඟු අත්වැලක් වූ මෙම ව්‍යාපෘතිය වරින් වර අක්‍රියවීම්වලට ලක්වීම වළක්වා ගැනීම සඳහා ස්ථිර පදනමක් සකස් කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0973/’10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2008 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන්,

(i) ජාතික වශයෙන් සමත්වීමේ ප්‍රතිශතය කොපමණද;

(ii) සමත්වීමේ ප්‍රතිශතය පළාත්, අධ්‍යාපන කලාප හා අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැඩිම සමත් ප්‍රතිශතය හිමි කර ගත් අධ්‍යාපන කොට්ඨාස 3 කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0981/’10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞදි අරාබි රාජ්‍යයේ ක්‍රියාත්මක වන නීතිය ඉස්ලාමීය ෂරීආ නීතිය බවත්;

(ii) ඉස්ලාමීය ෂරීආ නීතිය අනුව අධිකරණය විසින් යම් පුද්ගලයෙකුට මරණ දඬුවමක් නියම කිරීමේදී අදාළ වැරදිකරු නීති විරෝධී ක්‍රියාව හෝ අපරාධය සිදුකරන දිනය වන විට වයස අවුරුදු 18 ක් සම්පූර්ණවීම සැලකිල්ලට ගන්නා බවත්;

(iii) මේ වන සෞදි අරාබියේදී මරණ දඬුවම නියමවී ඇති රිසානා නෆීක් මෙනෙවිය එම අපරාධ චෝදනාවට ලක්වන අවස්ථාවේ ඇගේ සැබෑ වයස අවුරුදු 17ක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, රිසානා මෙනෙවියට ව්‍යාජ උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර නිකුත් කිරීමට සහායවූ නිලධාරීන්ට, ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර අයදුම්පත්‍රය සහතිකය කරන ලද සාම විනිසුරුවරයාට සහ විදේශගතවීමට සහායවූ විදේශ නියෝජිත ආයතනහිමියාට එරෙහිව මේ වනවිටත් ගෙන ඇති පියවර කවරේද;

(ii) රිසානාට එරෙහිව එරටේ අධිකරණයේ නඩු විභාගය පැවැත්වෙන අවස්ථාවේදී නිසි පරිදි කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත්වූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ඇයට එම දඬුවම හිමිවීම සම්බන්ධ සම්පූර්ණ වගකීම බාර ගත යුතු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 මාර්තු මස 25 වැනි සිකුරාදා)**

0882/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 ජුලි 29 වැනි දින 'ඩේලි මිරර්' පත්‍රයේ පලවූ ලිපියක, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය පිළිබඳ නීති සංශෝධනය වෙනුවෙන් අරගල කරන සමහර රාජය නොවන සංවිධාන අධික ලෙස මත්ද්‍රව්‍ය භාවිතය වැනි නීති විරෝධී කටයුතු වල යෙදෙන බව සඳහන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නීති විරෝධි කටයුතු පිළිබඳ තොරතුරු ඇති හා ඒවා විශේෂ අවධානයට ලක් කරනු ලබන පුවත්පත්වලින් එවන් ක්‍රියාකාරකම් පිළිබඳව ඔවුන් සතුව ඇති සාක්ෂි පිළිබඳව ප්‍රශ්න කිරීමට; හා

(ii) නීතිය ආරක්ෂා කළ යුතු බවට එවන් පුවත්පත් වලට දැනුම්දීමටත්, නීතියේ වෙනස්කම් තිබීම පිළිගතහැකි පිළිවෙතක් බවත්, අසංවර වචන භාවිතා කොට ඒවාට පහර නොදිය යුතු බවත් දැනුම්දීමට අවශ්‍ය පියවර එතුමා ගන්නෙහිද?

(ඇ) (i) ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීති කොමිසමේ අදහස් උක්ත ලිපියේ ඇතුලත්ද;

(ii) නිර්දේශ කොට ඇති නීති සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය කෙතරම් කාලයක් ගැනීමට බලාපොරොත්තු වන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0903/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අළුත්ගම, දර්ගා නගරය, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ අනුයුක්ත කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන එම්. ආර්. එම්. සිල්මි මහතා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා 2000/11/05 දින සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් වූ බවත්;

(ii) සුදුසුකම් සියල්ල සපුරා තිබුනත් කළුතර කලාප අධ්‍යාපන කාර්යාලයේ ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව සම්පූර්ණ කර නොතිබීම සහ නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා ඒ මහතාට අපේක්ෂිත උසස්වීම නොලැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අංක 82/2000 සහ 2000/08/24 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීන්දුව අනුව උසස් වීම් ලැබීම සඳහා උපාධිලත් අනුයුක්ත කථිකාචාර්යවරයෙකු 2000/08/24 දිනට වසර 5ක සේවා කාලය සම්පූර්ණ කර තිබීමේ අවශ්‍යතාව, ශාස්ත්‍රපති උපාධිධාරියෙකු (M.A) වූ සිල්මි මහතා 2000/07/11 දිනය වන විටත් සම්පූර්ණ කර තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, සිල්මි මහතාට එකී උසස්වීම ලබා දීම තවදුරටත් ප්‍රමාද කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2000/12/08 දින සිට ක්‍රියාත්මකවන පරිදි සිල්මි මහතා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කොට, එම තනතුරට අදාළ වැටුප් තලය අනුව සියලු හිඟ වැටුප් සහ දීමනා නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0907/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නාගරික සංවර්ධන අධිකාරිය මගින් ගාල්ල නාගරික බල ප්‍රදේශය තුළ මේ වන විට හඳුනාගෙන ඇති අනවසර හා නීති විරෝධී ඉදිකිරීම් සංඛ්‍යාව හා ඒවා පිහිටි ස්ථානයන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ඉදිකිරීම් අතුරින් ගාලු නගරයේ එක් අනවසර දෙමහල් ගොඩනැගිල්ලක උඩු මහලේ ආවරණය නොකරන ලද ගඩොල් බිත්තියක් වැසි ජලයෙන් දියවී කඩා වැටීමේ අවදානම් තත්වයක් මතුව ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ ගාලු දිස්ත්‍රික් අධ්‍යක්‍ෂ වෙත අංක 05/02/අන/පැ/44/62 හා 2010/02/09 දිනැතිව බලාත්මක අධ්‍යක්‍ෂවරයා විසින් දන්වා ඇති බවත්;

(ii) ඒ පිළිබඳව පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත ගාල්ල නාගරික කොමසාරිස් විසින් ME/UA/2008/103 හා 2008/09/15 දිනැති ලිපි මගින් දන්වා ඇති බවත්;

(iii) මේ දක්වා එම අනවසර හා අනතුරුදායක ඉදිකිරීම් කොටස කඩා ඉවත් කිරීමට පියවර ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත ''අ'' ඡේදයේ හඳුනාගත් අනවසර ඉදිකිරීම් සහ ''ආ'' ඡේදයේ සඳහන් අනවසර ගොඩනැගිල්ල පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය අනුගමනය කරන පිළිවෙත කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0908/'10

ගරු මොහමඩ් අස්ලම් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සුනාමි නිවාස වැඩ සටහන යටතේ, එක්සත් අරාබි එමීර් රජයේ අනුග්‍රහයෙන්, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරගොඩ, ප්‍රදේශයේ ''කලීෆාපුර'' නම් ගම්මානයේ පදිංචිකරුවන්ට නිවාස ඉදිකිරීමට පියවර ගනු ලැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වෙන්කර දෙන ලද මුළු මුදල කොපමණද;

(ii) එහි ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ නිවාස හිමිවූ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් නිවාස හිමියා සඳහා ලබා දුන් නිවාස මූල්‍යාධාරය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කලීෆාපුර නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ආයතනය හෝ රාජ්‍ය නොවන සංවිධානය කවරේද;

(ii) එහි අධීක්‍ෂණ කාර්යයන් සිදුකළ ආයතනය හෝ පුද්ගලයින් කවරේද;

(iii) එම ආයතනයේ හෝ පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2011 අප්‍රේල් මස 05 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0081/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වරාය සහ මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වකමුල්ල ග්‍රාම නිලධාරී වසමේ, තොරණ හංදියේ සිට ජල සම්පාදන මණ්ඩලය දක්වා මාර්ගයේ මීටර් 200 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ගැලවී, වලවල් සෑදී, අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්ත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0432/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රටක උද්ධමනය ගණනය කිරීමට බලය ලත් ආයතන කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය කොපමණද;

(iii) එක් එක් වර්ෂයේදී උද්ධමනය නිසා සිදුවන අගය අඩුවීම ගණන් බැලීමෙන් 1995 වර්ෂයේ රු.1000.00 ක අද වන විට මුදලේ තථ්‍ය වටිනාකම (1995 උපයන ලද රු. 1000.00 ක අද දින ක්‍රය ශක්තිය) කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රටේ ආර්ථිකය වගකීමෙන් තොරව මෙහෙයවීම වෙනුවෙන් වගකිවයුතු පුද්ගලයින්ගේ නම් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉන්දියාව, පාකිස්ථානය, මාලදිවයින, භූතානය, නේපාලය, සිංගප්පූරුව සහ මැලේසියාව වැනි රටවල උද්ධමනය පසුගිය වර්ෂ 5 සඳහා කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0535/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, සියඹලාණ්ඩුව - පොතුවිල් - අක්කරපත්තු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0791/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

(iv) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(v) ගුරු ඌනතාවයක් පවතින විෂයයන් කවරේද;

(vi) ගුරු ඌනතා පවතින ඉහත පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0834/'10

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලබා ගන්නා ලකුණු අනුව 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගනු ලබන මුල් පාසල් 50 තුළ 2009 සහ 2010 වර්ෂවල පැවති ශිෂ්‍යත්ව විභාගයන්ගෙන් සමත් සිසුන් සඳහා 2010 සහ 2011 වර්ෂයන්හිදී වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සියලු පාසල් තුළ හෝ ඇතැම් පාසල් තුළ 2009 වර්ෂයේ විභාගය සමත් වූ සිසුන් සඳහා 2010 වර්ෂයේදී 6 ශ්‍රේණියෙන් වෙන්කළ පුරප්පාඩු ප්‍රමාණයට වඩා, 2010 වර්ෂයේදී සමත්වූ සිසුන් සඳහා 2011 වර්ෂයේ වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව අඩුවී තිබේද;

(ii) එවැනි අඩුවීමක් තිබේ නම්, ඊට හේතු කවරේද;

(iii) 6 ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාවේ අඩුවීමක් තිබේ නම්, අවම වශයෙන් 2010 දී වෙන්කළ පුරප්පාඩු ප්‍රමාණය 2011 දී ද වෙන්කර දීමට පියවර ගන්නේද;

(iv) නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තහවුරු කිරීම සඳහා, ශිෂ්‍යත්ව විභාගය සමත්වන සිසුන් වෙනුවෙන් දිවයිනේ ජනප්‍රිය පාසල්වලින් වෙන් කරනු ලබන පුරප්පාඩු ප්‍රමාණය ඉදිරියේදී අඩු නොකර පවත්වා ගැනීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0904/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ යුධ, නාවික සහ ගුවන් හමුදා සඳහා අවි ආයුධ සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීමේදී සිදුවූ බව කියන අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු ශිරානි තිලකවර්ධන මහත්මිය සභාපතිත්වය දැරූ කොමිෂන් සභාවක් ගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම කොමිසම පත්කරන ලද දිනය කවරේද;

(iii) එකී කොමිසමේ සාමාජිකත්වය දැරූ අය කවරුන්ද;

(iv) එම කොමිසමේ වාර්තාව ගරු ජනාධිපතිතුමා වෙත භාරදෙන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කොමිසමේ විෂයය පරාසය කුමක්ද;

(ii) එමගින් ආවරණය කරන ලද කාලසීමාව කවරේද;

(iii) එම කොමිසන් වාර්තාව පරිදි අක්‍රමිකතා හඳුනාගත්තේ නම්, ඒවා කවරේද;

(iv) එම වාර්තාව සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම වාර්තාව මගින් අක්‍රමිකතා සඳහා වගකිවයුතු පුද්ගලයින් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවරුන්ද;

(iii) එම තැනැත්තන්ට එරෙහිව මේ වන විට ගෙන ඇති නීතිමය හෝ විනයානුකූල පියවර කවරේද;

(iv) එසේ පියවර නොගන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0927/'10

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැය;

(ii) එම සම්පූර්ණ පිරිවැයෙන් දේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iii) විදේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iv) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබෙන මාර්ග;

(v) සම්පූර්ණ පිරිවැයෙන් ණය වශයෙන් ලැබෙන ප්‍රමාණය;

(vi) ණය මුදල් ප්‍රදානය කරනු ලබන රටවල්, අදාළ පොලී ප්‍රමාණයන් සහ ණය පියවීමේ කාල සීමාවන්;

(vii) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාල සීමාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0968/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය කවරේද;

(ii) මෙම යෝජනා ක්‍රමය යටතේ ජලය ලබාදෙන ප්‍රදේශ කවරේද;

(iii) මෙම යෝජනා ක්‍රමය යටතේ ජල විදුලි බලාගාරයක් ඉදිකරනු ලබන්නේද;

(iv) එසේ නම්, එහි විදුලි ජනන ධාරිතාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපහුව ආසනය තුළ ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වලට ඉහත යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1007/'10

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ පාසල් පද්ධතිය තුළ සිටින වැඩ බලන විදුහල්පතිවරුගේ සංඛ්‍යාව කොපමණද:

(ii) වැඩ බලන විදුහල්පතිවරු සිටින පාසල්වල විදුහල්පතීන් ලෙස සේවය කිරීම සඳහා සුදුසුකම් ඇති, අධ්‍යාපන පරිපාලන සේවා විභාගය සමත්ව සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) ඊට අමතරව ඉහත පාසල්වල විදුහල්පති තනතුරු දැරීමට සුදුසුකම් ඇති, විදුහල්පති ශ්‍රේණීන් සමත්ව සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම විදුලහල්පතිවරු එම තනතුරු සඳහා පත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින තුළ ඇති ඉසුරු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) නවෝදයා පාසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් සඳහා පසුගිය වර්ෂ පහ තුළ වෙන්කර ඇති මුදල් ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වයඹ පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වලට බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සේවකයින් බඳවාගත් පාසල් කවරේද;

(iii) එම සේවකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0126/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පොල් සංවර්ධන මණ්ඩලයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනුයේ කලාප 6 ක් යටතේ බව එතුමා දන්නෙහිද?

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12 ක්, මෙම කලාප 6 හි නිලධාරීන් විසින් ආවරණය කිරීම තුළ පොල් ගොවීන්ගේ අවශ්‍යතාවයන් නිසියාකාරව ඉටුවන්නේ යැයි එතුමා සෑහීමකට පත්වන්නෙහිද?

(ඇ) මෙම නිලධාරීන් හමුවිය හැක්කේ බදාදා පමණක් වන බැව් එතුමා දන්නෙහිද?

(ඈ) මෙම දිස්ත්‍රික්කයේ පොල් වගා කිරීමේ ව්‍යාපෘතිය නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට එම තත්ත්වය බාධාවක් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ඉ) මෙම ගැටලු විසඳාලීම පිණිස හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා දැනට අනුමතවී ඇති කලාප 6, කලාප 10 ක් තෙක් වැඩි කිරීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0649/'10

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කටුනායක අධිවේගී මාර්ගය ඉදිකිරීමේ කටයුතු 2000 වර්ෂයේදී ආරම්භ කර පසුව අවලංගු කරනු ලැබුවේද;

(ii) එම ඉදිකිරීම් කටයුතු නතර කරනු ලැබූ දිනය කවරේද;

(iii) එම කටයුතු නතර කරන අවස්ථාව වන විට වැයවී තිබූ පිරිවැය කොපමණද;

(iv) අධිවේගී මාර්ගය සාදා නිම කිරීම සඳහා මුල් අවස්ථාවේදී ඇස්තමේන්තු කරන ලද පිරිවැය කොපමණද;

(v) කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එය යළි ආරම්භ කළ දිනය සහ ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) යළි වැඩ ඇරඹීම සඳහා වැයවූ මුදල කොපමණද;

(iv) වත්මන් කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගෙවා ඇති දඩ මුදල්ද ඇතුළත්ව මෙම ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදලේ පොලී අනුපාතිකය කවරේද;

යන්නද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0792/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කඹුරුපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතා පවතින ඉහත පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0918/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේනානිගල ප්‍රදේශයේ පදිංචි කිරීමට තීරණය කර ඇති ආදිවාසී පවුල් සංඛ්‍යාව;

(ii) මේ වන විට පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව;

(iii) එම පවුල්වලට අයත් පුද්ගලයින් සංඛ්‍යාව;

(iv) එක් පවුලක් සඳහා ලබා දීමට නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය;

(v) මේ වනවිට ඔවුන්ට ලබා දී ඇති හෝ ලබා දීමට අදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය;

කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආදිවාසී පවුල් වෙනුවෙන් සේනානිගල ප්‍රදේශයෙන් ලබාදීමට නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය ඔවුන් වෙත ලබා නොදීමේ වැඩ පිළිවෙළක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0928/'10

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට, මත්තල නව ගුවන් තොටුපල ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ පිරිවැයෙන් දේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(ii) විදේශීයව සපුරා ගන්නා ප්‍රමාණය;

(iii) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබෙන මාර්ග;

(iv) සම්පූර්ණ පිරිවැයෙන් ණය වශයෙන් ලැබෙන ප්‍රමාණය;

(v) ණය මුදල් ප්‍රදානය කරනු ලබන රටවල්, අදාල පොලී ප්‍රමාණයන් සහ ණය පියවීමේ කාල සීමාවන්;

(vi) සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට ගතවන කාල සීමාව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ශ්‍රමිකයින් බඳවා ගන්නා ක්‍රමය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0969/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය යටතේ ජලය ලබා දෙන ප්‍රදේශ කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මෙම යෝජනා ක්‍රමය යටතේ දඹුල්ල හරහා මී ඔය ඔස්සේ යාපහුව හා ගල්ගමුව ප්‍රදේශවලට ජලය ගෙන ඒමට සැළසුම් කර තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) යාපහුව හා ගල්ගමුව ප්‍රදේශවලට ජලය ලබා දීමට වෙනත් ක්‍රමවේදයක් ඉදිරිපත් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2011 අප්‍රේල් මස 05 වැනි අඟහරුවාදා)**

0222/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාලසීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0672/'10

ගරු අනුර දිසානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 10 තුළ, කෘෂි කාර්මික අවශ්‍යතාවයන් සඳහා,

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශ මඟින් ආනයනය කර ඇති පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත දෙපාර්ශ්වය විසින් ආනයනය කළ එක් එක් පොහොර වර්ගයේ ප්‍රමාණය, ආනයනය කළ රටවල් හා මිල ගණන් වාර්ෂික පදනම මත, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0673/'10

ගරු අනුර දිසානායක මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 10 තුළ, කෘෂිකාර්මික කටයුතු සඳහා,

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් නිෂ්පාදනය කළ මුළු පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත පරිදි නිපදවූ පොහොර ප්‍රමාණය, එක් එක් පොහොර වර්ගය හා නිෂ්පාදනය කළ අංශය අනුව වෙන් වෙන් වශයෙන්, වාර්ෂික පදනම මත කවරේද;

(iii) වාර්ෂිකව රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් නිපදවූ මුළු පොහොර ප්‍රමාණයේ වෙළෙඳපොළ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0675/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 10 තුළ,

(i) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් වාර්ෂිකව ආනයනය කළ කෘෂිකර්මාන්තයට අදාළ බීජ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත පරිදි ආනයනය කළ එක් එක් බීජ වර්ගයේ ප්‍රමාණයන්, වටිනාකම්, ආනයන කළ රටවල් සහ මිල ගණන් රාජ්‍ය හා පෞද්ගලික අංශ අනුව හා වාර්ෂික පදනම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0676/'10

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ 10 තුළ,

(i) වාර්ෂිකව, රාජ්‍ය හා පෞද්ගලික අංශය මඟින් කෘෂිකර්මාන්තය සඳහා නිෂ්පාදනය කළ එක් එක් බීජ වර්ගයේ ප්‍රමාණයන් එම අංශ අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද ;

(ii) එම බීජවල වෙළෙඳපොළ වටිනාකම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0858/'10

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බස්නාහිර, සබරගමුව, වයඹ, මධ්‍යම, ඌව, උතුරු මැද, නැගෙනහිර සහ උතුරු පළාත් සභාවන් තුළ මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් පාසල්හි සේවය කරන ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවීමට තිබේද යන්න එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ හිඟ වැටුප් ගෙවීමට තිබේ නම්, 2010.01.01 දින වනවිට ඒ ඒ පළාත් මට්ටමින් ගුරුවරුන්ට ගෙවිය යුතු හිඟ වැටුප් ප්‍රමාණයන්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම හිඟ වැටුප් ගෙවීමට රජය මඟින් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ වෙන්කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හිඟ වැටුප් නොගෙවීමෙන් එම ගුරුවරුන්ට අසාධාරණයක් වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ගුරුවරුන්ට හිඟ වැටුප් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0909/’10

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සම්මන්තුරේ අංක 3, එම්. පී. සී. එස්. පටුමගේ, අංක 343/2 දරන ස්ථානයේ පදිංචි, ඒ. එම්. ඉස්මයිල් මහතා (උ.පො.කො. 20302) සම්මන්තුරේ පොලිස් ස්ථානයේ සිට පොතුවිල් පොලිස් ස්ථානයට අනුයුක්තකොට සේවයේ යෙදී සිටියදී සර්පයකු දෂ්ඨ කිරීමෙන් සේවයට වාර්තා කිරීමට නොහැකිවීම දැනුම්දීම ප්‍රමාදවීම හේතුකොටගෙන ඔහුගේ සේවය අත්හිටුවන ලද බවත්;

(ii) ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙසට ඉදිරිපත් කරන ලද අභියාචනා පිළිබඳව පරීක්ෂණ මේවන විට නිමවී ඇති අතර අම්පාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි විසින් අංක එස්/2/1/380/09 හා 2009/06/05 දිනැති ලිපිය මඟින් නැගෙනහිර දිසාව (දකුණ) නියෝජ්‍ය පොලිස්පතිවරයාට ඉස්මයිල් මහතා නැවත සේවයේ පිහිටුවීමේ ලිඛිත නිර්දේශයක් ලබා දී ඇතත්, මෙතෙක් ඔහු නැවත සේවයේ පිහිටුවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, සේවය අත්හිටවූ කාලයේ අපරාධ හෝ ත්‍රස්ත ක්‍රියාවල නොයෙදී, යහපත් හා චරිතවත් පැවැත්මෙන් සිටි ඉස්මයිල් මහතා 1998 වර්ෂයේ සිට ක්‍රියාත්මකවන පරිදි නැවත සේවයේ පිහිටුවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 අප්‍රේල් මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0228/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, බෙලිඅත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌනතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0444/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) පසුගිය වර්ෂ පහ තුළදී වාර්තා වූ අසාර්ථක මූල්‍ය සමාගම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) තැන්පත්කරුවන්ගේ මුදල් භාරගත් සමාගම් මගින් මුදල් ගෙවනු නොලැබූ සමස්ත තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ගෙවීම පැහැර හරින ලද සමාගම් කවරේද;

(iii) මහ බැංකුව මැදිහත් වී කිසිදු සමාගමක් බංකොලොත්භාවයට පත් නොවනු ඇති බවට සහතිකවීමෙන් පසුවත් 2010.06.01 දිනට IFC සහ CIFC තැන්පත්කරුවන්ට තම ඉතිරිකිරීම් අහිමි වූයේ කෙසේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම සමාගම් වල අධ්‍යක්ෂවරුන්ට සිදුවී ඇත්තේ කුමක්ද;

(ii) මෙම මූල්‍ය සමාගම් පිළිබඳ වාර්තා කිරීමේදී බැංකු විසින් අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් ප්‍රමිතීන් අනුගමනය කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට පැහැදිලි කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0536/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, පොතුවිල් - පානම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0559/'10

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) පසුගිය ජනාධිපතිවරණයේදී ඉදිරිපත් කළ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ "විශ්‍රාමික දිවියට අත්වැලක්" යටතේ විශ්‍රාමිකයන්ට සහනයක් වශයෙන් 2006 ට පෙර විශ්‍රාම ලැබූ අයට 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන අයුරින් විශ්‍රාම වැටුප සකස් කොට ඊළඟ අයවැයේ සිට (2010) ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව 2010 අයවැයේදී 2006 ට පෙර විශ්‍රාම ගිය අයට, 2006 වැටුප් ක්‍රමයට ගැලපෙන ලෙස විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) එම සහනය 2010 අය වැයෙන් ලබා දී නැත්නම්, ඊට හේතු කවරේද;

(iv) එම විශ්‍රාම වැටුප් වැඩිවීම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0806/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) සිසුන් සියයට අඩු පාසල්වලින් දැනට වසා දැමීමට තීරණය කර ඇති පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නෙහිද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0880/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සම්පූර්ණ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ආ) එම එක් එක් වර්ෂයේදී,

(i) දේශන ගාස්තු වශයෙන් අයකර ගන්නා ලද මුදල;

(ii) නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ අයදුම්පත් ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iii) එම විභාගයේ විභාග ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iv) වෙනත් ක්‍රම මගින් ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ලැබුණු ආදායම;

(v) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) 2009 වර්ෂය සඳහා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවේ දක්වා ඇති පරිදි දේශන ගාස්තු වැඩිකිරීමකින් තොරව ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යෑමට නොහැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ මන්ද?

0970/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුංගාවිල සිට සෝමාවතී රජමහ විහාරය දක්වා මාර්ගය පිළිසකර කිරීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ අනුමතිය අනුව වෙන් කර තිබූ මුදල කවරේද;

(ii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා අනුමත කළ ඇස්තමේන්තු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම මුදල් පාලනය කළ අධිකාරිය හෝ දෙපාර්තමේන්තුව කවරේද;

(ii) එම මුදල් පාලනය සඳහා පත් කළ නිලධාරීන් කවරුන්ද;

(iii) දැනට එම මුදලින් ඉහත මාර්ගයේ පිළිසකර කටයුතු සඳහා වියදම්කර තිබෙන ප්‍රමාණය කවරේද;

(iv) එම මුදල් පාලනයේදී අක්‍රමිකතා සිදුවී තිබේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය සිදු කළ පරීක්ෂණයේ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0988/'10

ගරු ජෝන් අමරතුංග මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවකයන් වෙත නිවාස ලබාදීම සඳහා නිල සෙවන නමින් නිවාස ව්‍යාපෘතියක් රාගම නගරය ආශ්‍රිතව ඉදිකිරීමට පියවර ගනු ලැබුවේද;

(ii) එසේ නම්, එය ආරම්භ කළ දිනය කවරේද;

(iii) යෝජිත නිවාස ව්‍යාපෘතිය මගින් ඉදිකිරීමට සැලසුම් කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) දැනට එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර ඇත්නම්, මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කවරේද;

(v) එකී නිවාස ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0242/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ලුණුගම්වෙහෙර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0650/'10

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක කර්මාන්තය සංවර්ධනය කළ හැකි ප්‍රදේශ ලෙස අලුතින් හඳුනාගෙන ඇති ප්‍රදේශ කවරේද;

(ii) කුච්චවේලි සහ කල්පිටිය ප්‍රදේශවල අක්කර 500 ක ප්‍රදේශයක් එම තෝරාගත් ප්‍රදේශයට ඇතුළත් වන්නේ ද;

(iii) ඒ සඳහා රජය ආයෝජනය කර ඇති මුදල කවරේද;

(iv) මෙම ආයෝජන තුළින් අමාත්‍යාංශය ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

(v) මෙසේ පහසුකම් සැලසීමට බලාපොරොත්තු වන සංචාරකයන්ගේ තරාතිරම සහ ජාතිකත්වයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංචාරක අරමුදලක් ආරම්භ කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින්නේ ද;

(ii) මෙම අරමුදලට රජයෙන් ලබාදෙන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) (i) පෞද්ගලික සමාගම් 10ක් මිලියන පන්සියයක මුදලක් රට තුළ ආයෝජනය කිරීමට කටයුතු කරමින් සිටින්නේද;

(ii) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

යන්නත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0660/'10

ගරු අජිත් කුමාර මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුමනසේන රාමසිංහ මහතා දකුණු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුනු තනතුර, දිනය, සේවා කාලය, විශ්‍රාම ගිය දිනය හා එදිනට දැරූ තනතුර කවරේද;

(ii) ඔහු ලබාගෙන ඇති සේවා දිගු සංඛ්‍යාව හා අදාළ වර්ෂයන් කවරේද;

(iii) සේවා දිගු නිර්දේශ කළ නිලධාරියාගේ නම, තනතුර හා ලිපිනය කවරේද;

(iv) සේවා දිගු සඳහා සපුරාලිය යුතු නිර්ණායක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රාමසිංහ මහතා මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වූ දිනය කවරේද;

(ii) මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකුට හිමිවන වරප්‍රසාද හා පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රාමසිංහ මහතාට ඔහුගේ සේවා කාලය තුළදී කිසියම් වරදක් සඳහා චෝදනා පත්‍ර ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළව විනය පරීක්ෂණ පවත්වා තිබේද;

(iii) ඔහු කිසියම් වරදකට වැරදිකරු වී, යම් දඬුවමක් ලබා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) රාමසිංහ මහතාට විශ්‍රාම වැටුප ලබාදීමට පත්වීම් බලධාරියා විසින් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) ඊට අදාළ නීතිමය තත්ත්වය කවරේද;

(iii) පරිපාලනමය අඩුපාඩුවක් නිසා රාමසිංහ මහතාගේ විශ්‍රාම වැටුප් සැකසීම ප්‍රමාද වී ඇත්නම්, එම විශ්‍රාම වැටුප සකස්කර දෙනු ලබන කාල රාමුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0807/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අකුරැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල්වලින් සිසුන් සියයට අඩු පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල් තිබේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වල නම් කවරේද;

(iv) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(v) එම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නෙහිද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0881/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින,

(i) රජයේ අධිනීතිඥවරුන්ගේ සංඛ්‍යාව;

(ii) රජයේ නීතිඥවරුන්ගේ සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නීතිපති දෙපාර්තමේන්තුවේ වගකීම් ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍යකරන රජයේ අධිනීතිඥවරුන්ගේ සංඛ්‍යාව සහ රජයේ නීතිඥවරුන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නීතිපති දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0919/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් සඳහා පුස්තකාල සහ රසායනාගාර සේවක පිරිස් බඳවාගැනීමේ දී සලකා බලනු ලබන මූලික අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) පාසල් කාර්ය මණ්ඩල අන්තර්ග්‍රහනය කිරීම යටතේ උක්ත සේවක පිරිස්වල තනතුරු නාමය වෙනස් කිරීමකට ලක් කර තිබේද;

(iii) එසේ නම්, එම නාමය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාසල් කාර්ය මණ්ඩල අන්තර්ග්‍රහනය නිසා සාපේක්ෂව පාසල් නොවන අන් කාර්ය මණ්ඩලවලට වඩා වැඩි අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති පුස්තකාල හා රසායනාගාර සේවක පිරිසට බලවත් අසාධාරණයක් සිදුවී ඇති බවත්;

(ii) එම හේතුවෙන් ඔවුන් මානසික පීඩාවට ලක්ව ඇති බවත්;

(iii) ඔවුන්ගේ තනතුරුවලට අදාළ ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමේ දී ගැටලු මතුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ට සිදුවී ඇති මෙම අසාධාරණය ඉවත් කිරීම සඳහා අදාළ අන්තර්ග්‍රහනය සංශෝධනය කිරීමට හෝ ඉවත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0999/'10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝකයේ වාරි හා කෘෂි ශිෂ්ඨාචාරය අනුව ශ්‍රී ලංකාවට ඉතා වැදගත් තැනක් හිමිවන හෙයින් එම තත්ත්වය මතු පරපුරට දායාද කිරීමට හැකිවන පරිදි ජල හා වාරි කෞතුකාගාරයක් ඉදිකිරීම සුදුසු බවත්;

(ii) එමගින් ලාංකීය කෘෂි හා වාරි කර්මාන්ත ඉතිහාසය පිළිබඳව අනාගත පරපුරට අධ්‍යයනය කිරීමට අවස්ථාව සැලසෙන බවත්;

(iii) එවැනි කෞතුකාගාරයක් ඉදිකිරීම මගින් වාරි හා කෘෂි ක්ෂේත්‍රයේ නියැලී සිටින අයට පර්යේෂණ කිරීමට අවස්ථාවක් සැළසෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, එවැනි කෞතුකාගාරයක් ඉදිකිරීම කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 අප්‍රේල් මස 07 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0237/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌනතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0376/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ළූණු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ ඛනිජ තෙල් මත පැනවෙන තීරු බදු සහ අනෙකුත් සියලු ආකාරයේ බදු ප්‍රමාණ කොපමණද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ ඉහත සඳහන් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රමාණයන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ බදු පැනවීමෙන් උපයාගත් ආදායම කොපමණද;

(iv) එකී භාණ්ඩ අතරින් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන යම් භාණ්ඩ වේ නම්, පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල නිෂ්පාදන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල වාර්ෂික පරිභෝජනය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0539/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නැගෙනහිර පළාතේ, බෝගහවැව - පුල්මුඩේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0795/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, රංචාගොඩ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කන්දබඩපත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) අතිරේක රෙජිස්ට්‍රාර් ධූරය සඳහා අයදුම්පත් කැඳවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අයදුම්පත් කැඳවනු ලැබූ දිනය කවරේද;

(ii) එම ධූරය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් කවරේද;

(iii) මෙම ධූරය සඳහා අයදුම් කළ සංඛ්‍යාව කවරේද;

(iv) අයදුම්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත තනතුරට අදාළ සම්මුඛ පරීක්ෂණ මේ වන විට පවත්වා තිබේද;

(ii) එම සම්මුඛ පරීක්ෂණයේදී එක් එක් අයදුම්කරුවන් ලබාගත් ලකුණු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වන විට සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම්ලත් අයෙකු එම ධූරය සඳහා තෝරාගෙන තිබේද;

(iv) එසේ නම්, එම තැනැත්තාගේ නම කුමක්ද;

(v) නොඑසේ නම්, සුදුසුකම්ලත් අයෙකු මෙතෙක් පත් නොකිරීමට හේතුව කවරේද;

(vi) තනතුර සඳහා අයෙකු පත් කරන්නේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0854/'10

ගරු අජිත් කුමාර මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 ජූනි 30 වන විට වයඹ පළාතේ වාර්තාගත අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2009 වර්ෂයේ සහ 2010 ජූනි 30 දක්වා වයඹ පළාත තුළ අලි - මිනිස් ගැටුම් හේතුවෙන් මිය ගොස් තිබෙන අලි ඇතුන් සංඛ්‍යාව හා මිනිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මියගිය පුද්ගලයින් සඳහා වන්දි ගෙවීමට කටයුතු කොට තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වයඹ පළාත තුළ වනජීවී දෙපාර්තමේන්තුවේ,

(i) කාර්ය මණ්ඩලය සහ සේවා ස්ථාන;

(ii) කාර්ය මණ්ඩල සඳහා සපයා ඇති රථ වාහන සංඛ්‍යාව;

(iii) කාර්ය මණ්ඩල සඳහා 2009/2010 වර්ෂවලදී වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වයඹ පළාත තුළ පවතින අලි - මිනිස් ගැටුම අවම කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0911/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 සැප්තැම්බර් මාසයේ දකුණු අප්‍රිකාවේ පැවති චැම්පියන්ස් ලීග් 20 - 20 ක්‍රිකට් තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද "වයඹ" කණ්ඩායම සඳහා අනුග්‍රාහකත්වය දක්වන ලද්දේ Musli Power X-tra නම් වූ වෙළඳ නාමයක් සහිත ආයතනයක් විසින්ද;

(ii) එම ආයතනය කවරක්ද;

(iii) එම ආයතනය විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) Musli Power X-tra වෙළඳ නාමය යටතේ අලෙවිකරනු ලබන්නේ ලිංගික උත්තේජනය සඳහා භාවිතා කරන නිෂ්පාදනයක් ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එසේ නම්, එම නිෂ්පාදනයට අදාළ ලාංඡනය "වයඹ" ක්‍රිකට් කණ්ඩායමේ තරඟ කටයුතු අතරදී ප්‍රචාරය කිරීම එම ක්‍රීඩකයන්ගේ සහ රටේ ප්‍රතිරූපයට හානිකර බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) ඉහත තරඟාවලිය සඳහා අනුග්‍රහකයන් තෝරා ගැනීමේදී වගකීමෙන් තොරව ක්‍රියාකළ නිලධාරීන්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0238/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌණතාවයන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් පද්ධතිය තුළ විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටුකරලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0651/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල ආරම්භ කරන ලද වසර, එය ආරම්භ කරන ලද පුද්ගලයාගේ නම සහ එය ආරම්භ කිරීමේ අරමුණ කවරේද;

(ii) වර්තමානයේදී ප්‍රාග්ධන අරමුදලට වෙන් කොට ඇති මුදල් ප්‍රමාණය කවරේද;

(iii) අරමුදල ආරම්භයේ සිට මේ දක්වා එක් එක් වසරේදී ප්‍රාග්ධනය ලෙස අරමුදලට එක් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ආ) (i) අරමුදලේ වර්තමාන භාරකරුවන්ගේ නම් කවරේද;

(ii) මහපොළ භාරකාර අරමුදල ආරම්භයේ සිට මේ දක්වා එහි මුදල් උපයෝගී කොට ගෙන මිලදී ගෙන් සියලුම ඉඩම්වල නම් කවරේද;

(iii) එම එක් එක් ඉඩම ගත් මිල හා ඒවායේ වර්තමාන වෙළඳපොල මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත කී ඉඩම්වලින් කිසිවක් විකුණා තිබේද;

(v) එසේ නම්, එක් එක් ඉඩම විකිණීමේ අරමුණ සහ විකුණන ලද මිල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහපොළ ශිෂ්‍යත්ව අරමුදල මගින් වර්තමානයේදී ප්‍රතිලාභ ලබාදෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) මහපොළ ශිෂ්‍යත්වලාභියකුට මාසිකව ලබා දෙන ශිෂ්‍යත්ව දීමනාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0540/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය - තිරික්කොණ්ඩියාඩුමඩු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්;

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0800/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දැනට ක්‍රියාත්මක වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ දාහතකින් ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හා සීමාවාසික පුහුණුව සාර්ථකව නිමකළ, මෙතෙක් ගුරු පත්වීම් නොලැබූ ගුරු ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විශාල පිරිසක් සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 දෙසැම්බර් සිට මේ දක්වා ගුරු පත්වීම් නොලබා සිටින එම ඩිප්ලෝමාධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරු ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා පත්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් මේ වන විට සකසා තිබේද;

(iii) එසේ නම්, 2010 හා 2011 වර්ෂ තුළ පත්වීම් ලබා දෙනු ලබන ගුරු සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 හා 2011 වර්ෂවලදී එම පත්වීම් ලබා දෙන දින වකවානු කවරේද;

(v) එම පත්වීම් ලබා දීම සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(vi) එසේ නම්, 2010 හා 2011 වර්ෂ සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vii) එම ප්‍රතිපාදනයන් වෙන්කරන ලද වැයශීර්ෂ හා ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0914/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමර්සෙට් එන්ටර්ටේන්මන්ට් වෙන්චර්ස් (සිංගප්පූරු) පෞද්ගලික සමාගම (Somerset Entertainment Ventures (Singapore) Pvt. Ltd.) සමඟ ගිවිසුමකට එළඹී තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුමට එළැඹි දිනය හා ඊට අදාළ කරුණු කවරේද;

(iii) එම ගිවිසුමේ වටිනාකම කොපමණද;

(iv) එකී ගිවිසුම සභාගත කරන්නේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත කී සමාගම,

(i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්නම්, ලියාපදිංචි අංකය කවරේද;

(ii) එම සමාගම වෙනත් රටක ලියාපදිංචි සමාගමක් නම්, එම ලියාපදිංචි රට, දිනය හා අංකය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත කී ගිවිසුමට අදාළ දැන්වීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් තම වෙබ් අඩවියේ පමණක් ප්‍රචාරණය කරන ලැබුවේද;

(ii) එම දැන්වීම ප්‍රචාරය කළ දිනය කවරේද;

(iii) ඉහත කී සමාගම ක්‍රිකට් ක්‍රීඩාව හා සම්බන්ධව මීට ප්‍රථම ගිවිසුම්වලට එළඹී තිබේද;

(iv) එසේ නම්, ඒ අවස්ථාවන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0246/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, බෙලිඅත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0654/'10

ගරු රවී කරුණානායක මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී අලෙවි මණ්ඩලය විවෘත කරනු ලැබූ දිනය කවරේද;

(ii) 1995 දී එය වසා දැමීමට හේතු කවරේද;

(iii) වී අලෙවි මණ්ඩලය පිහිටුවීමේ අරමුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 4-5 තුළදී වී අලෙවි මණ්ඩලය විසින් මිළදී ගනු ලැබූ වී ටොන් සංඛ්‍යාව කොපමණද;

(ii) යල සහ මහ කන්නවල වී නිෂ්පාදනයට සාපේක්ෂව වී අලෙවි මණ්ඩලය විසින් මිළදී ගත් වී ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) වී වල අවම විකුණුම් මිළ ඉහළ නැංවීමට වී අලෙවි මණ්ඩලයට හැකි වූයේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0801/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, රජය මගින් පාලනය වන ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල් අතරින් ගුරු අතිරික්තයක් පවතින පාසල් කවරේද;

(iv) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පාසල්වලින් ගුරු ඌනතා පවතින පාසල් කවරේද;

(ii) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වලට ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0920/’10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථා නිෂ්පාදනාගාරය තුළ 2010 අගෝස්තු මාසයේ දිනක වැරදි බෙහෙත් කලවම් කිරීමක් සිදුවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්,

(i) වැරදි ලෙස නිපදවූ එම බෙහෙත් තොගය මේ වන විට භාවිතයෙන් ඉවත්කර තිබේද;

(ii) එම වරද සිදුකළ පුද්ගලයා හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගය කවරේද;

(iii) මේ පිළිබඳව ඖෂධ අධිකාරියට වාර්තා වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම වැරදීමෙන් පසු නිෂ්පාදනාගාරය ජී. එම්. පී. (Good Manufacturing Practice) ක්‍රියාවලිය අනුව පිරිසිදු කිරීමකට ලක්කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) වැරදි ලෙස සිදුව ඇති ඖෂධ නිෂ්පාදනය නිසා සංස්ථාවට සිදුවූ පාඩුව කොපමණද;

(ii) එම පාඩුව වසන් කිරීම සඳහා අදාළ බෙහෙත් තොගය වෙළඳ පොළ වෙත නිකුත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2011 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0214/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0247/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේනම් එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0445/’10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මේ දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රැකියා සඳහා විදේශගත වන පුද්ගලයන් රක්ෂණ සැලැස්මක් තුළින් ආරක්ෂා කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එවැනි රක්ෂණ ආවරණයක් සඳහා එක් පුද්ගලයකුගෙන් කොපමණ මුදලක් අයකරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂයේදී ඉල්ලා සිටි රක්ෂණ හිමිකම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) රක්ෂණ ගිවිසුම සඳහා මුදල් ගෙවා තිබුනද, රක්ෂණ හිමි පුද්ගලයන්ට හිමිකම් නොලැබීමට හේතු කවරේද යන්න එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0678/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදිවන ඉඩම රජය විසින් බදු හෝ වෙනත් ක්‍රමයකට බාහිර පාර්ශ්වයක් වෙත පවරනු ලැබුවේද;

(ii) එසේ පවරා දෙනු ලැබුවේ කවරෙකුටද;

(iii) එම ඉඩම පවරා දුන් මුදල, පැවරුම සිදුකළ වර්ෂය හා ඉඩමේ ප්‍රමාණය කවරේද;

(iv) එම ක්‍රීඩාපිටිය ගොඩනැඟීමෙන් පසු එහි අයිතිය පැවරෙන පාර්ශ්වය කවරෙක්ද;

(v) පවරනු ලබන කාල සීමාව හා මුදල කොපමණද;

(vi) එමගින් අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ක්‍රීඩාංගනය ඉදිකිරීම් සඳහා වැය වන මුළු මුදල කොපමණද;

(ii) එම මුදල වැය කරනු ලබන්නේ රජය හෝ රජයේ ආයතනයක් විසින්ද; නැතහොත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හෝ වෙනත් ආයතනයක් විසින්ද;

(iii) එසේ නම්, එක් එක් පාර්ශ්ව විසින් වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගනය සහ එහි ගෘහ නිර්මාණ කටයුතු සඳහා උපදෙස් ලබා දෙන්නේ කවරුන්ද;

(ii) ක්‍රීඩාපිටිය, ක්‍රීඩා මණ්ඩපය, දිවා රාත්‍රී විදුලි බුබුළු හා වාර්ෂික නඩත්තුව සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0802/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අකුරැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව ;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0215/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0248/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0686/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 සැප්තැම්බර් 01 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව මගින් වෙන්දේසි කරනලද ශ්‍රී ලංකා රජයේ රන් සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) එසේ වෙන්දේසි කරන ලද රත්තරන්වල වටිනාකම එක්සත් ජනපද ඩොලර්වලින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් වෙන් වෙන් වශයෙන් කොපම

(iii) රජය විසින් රත්තරන් මිලදී ගැනීමට ගෙවූ මිල ගණන් කවරේද;

(iv) රාජසන්තක කරනලද රත්තරන් ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ රන් සංචිතවලට එක් කරනු ලැබුවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයට අයත් රත්තරන් ප්‍රමාණයක් පසුගිය වසර දෙක තුළ විකුණනු ලැබුවේද;

(ii) එසේ නම්, එම රත්තරන්වල අලෙවි මිල කවරේද;

(iii) එම රත්තරන් විකිණීම ටෙන්ඩර් කැඳවීමක් හෝ වෙන්දේසි කිරීමක් මගින් සිදුකරන ලද්දේද;

යන්නත් එතුමා දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0803/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මාලිම්බඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0921/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ සභාපතිවරයාගේ සම්පූර්ණ නම හා වයස කවරේද;

(ii) මෙම තනතුරට පත්වීමට පෙර ඔහු සේවය කළ ස්ථානය හා තනතුර කවරේද;

(iii) ඔහුගේ වෘත්තීය පලපුරුද්ද කවරේද;

(iv) ඔහුගේ මාසික වැටුප හා ලැබෙන වෙනත් දීමනා කවරේද;

(v) ඔහු එම තනතුරට පත් කළ බලධාරියා කවරුන්ද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0251/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිස්සමහාරාම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල,

(i) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල්වල නම් සහ අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළ අධ්‍යාපනයේ නවෝදයක් ඇති වන බැව් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0691/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ වූ දින සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු පිහිටුවීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම එක් එක් බැංකුවේ ප්‍රධාන ශාඛාව යටතේ ක්‍රියාත්මක වන බැංකු ශාඛා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත බැංකුවල ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය කොපමණද; සහ

(iv) අද වන විට වාණිජ බැංකුවලට අවශ්‍ය වන කොටස් ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත බැංකු අතරින් ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ තිබෙන කවර හෝ බැංකුවක් විදේශීය බැංකුවක් මිලදී ගැනීමට මුදල් ගෙවා තිබේද; සහ

(ii) එසේ නම්, එම බැංකුවේ නම සහ එම බැංකුව මගින් අනුමත කර ඇති මුදල් ප්‍රමාණය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වාණිජ නොවන බැංකු සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන වාණිජ නොවන බැංකු සංඛ්‍යාව කවරේද;

(iii) එම බැංකුවල කොටස් ප්‍රාග්ධනය කොපමණද;

(iv) යම්කිසි වාණිජ හෝ වාණිජ නොවන බැංකුවක් බංකොළොත් තත්ත්වයට පත්වී තිබේද;

(v) එසේ නම්, එම බැංකුවල සහ ඒවායේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0804/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවයන්ගේ ඌනතාවයන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව ;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩුපාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩුපාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0859/'10

ගරු අජිත් කුමාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල බස් නැවතුම්පල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(ii) මෙම ඇස්තමේන්තුව සකස්කළ ආයතනය කුමක්ද;

(iii) එම ඇස්තමේන්තුව හා ගොඩනැගිල්ලේ සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියට අදාළ,

(i) කොන්ත්‍රාත්කරු හෝ කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(ii) උපදේශක සමාගමක් හෝ ආයතනයක් තිබේ නම්, ඒ කවරේද;

(iii) අධීක්ෂණ කටයුතු කරනු ලබන ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම බස්නැවතුම්පලේ ස්වභාවය හා අදාළ ගොඩනැගිල්ල තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ආයතන හෝ ව්‍යාපාර කවරේද;

(ii) මෙම ගොඩනැගිල්ල තුළ ව්‍යාපාරික ස්ථාන ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කුමක්ද;

(iii) බස්නැවතුම්පල ඉදිකිරීමට සමගාමීව බස් නැවතුම්පල අවට සහ ගාලු නගරයේ අනිකුත් ප්‍රදේශවලින් ඉවත් කරන ලද පදික වෙළඳුන්ට හා තාවකාලික ව්‍යාපාරික ස්ථාන හිමියන්ට ලබාදෙන සහනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0922/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 06 ක කාලය තුළ බාල වර්ගයේ ඖෂධ ගෙන එන ලද සමාගම් ලෙස හඳුනාගෙන ඇති සමාගම් සංඛ්‍යාව කවරේද;

(ii) එම සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් සමාගම විසින් බාල වර්ගයේ ඖෂධ ගෙන ඒම නිසා රජයට සිදුවූ පාඩුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් සමාගම් විසින් රජයට ආපසු ගෙවා ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බාල වර්ගයේ ඖෂධ ගෙන ආ බවට හඳුනාගෙන ඇති එක් එක් සමාගමේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම සමාගම් අතුරින් මේ වන විට අපලේඛනගත කර (Black list), තහනම් කර ඇති සමාගම් සංඛ්‍යාව කවරේද;

(iii) ඒ සමාගම්වල නම් කවරේද;

(iv) ඉහත පරිදි තහනම් කර ඇති සමාගම්වලින් වර්ෂ 2006 සිට 2010 දක්වා කාල සීමාවේදී නැවත ඖෂධ මිලදී ගැනීම් සිදුකර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

ගරු රවි කරුණානායක මහතා,— ජනාධිපතිවරයා සහ අගමැතිවරයා විසින් අමාත්‍ය ධුරයන් දැරීම යෝග්‍ය නොවීම,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2010 ඔක්තෝබර් මස 08) "ඉතා ඵලදායී පරිපාලනයක් පවත්වාගෙන යාමටත්, අමාත්‍යවරුන්ගේ කටයුතු නිසි ලෙස සමාලෝචනය කිරීමටත්, ජනාධිපතිවරයා හා අගමැතිවරයා විසින් කිසිදු අමාත්‍ය ධුරයක් දැරීම යෝග්‍ය නොවන බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 1/'10]

පා. 4/'10

ගරු රවි කරුණානායක මහතා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (PAC) සහ උපදේශක කාරක සභාවල සියලුම රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබාදීම,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සහ උපදේශක කාරක සභාවල සියලුම රැස්වීම්වලට මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වය තුළින් එම සාකච්ඡා වඩාත් ඵලදායී, අර්ථවත් හා විනිවිදභාවයකින් යුක්ත වනු ඇති බැවින් මාධ්‍යවේදීන්ට එම රැස්වීම්වලට සහභාගි වීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/'10

ගරු රවි කරුණානායක මහතා,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට කෘෂිකාර්මික ණය ලබා දීම,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට 5% ක අඩු පොළී අනුපාතයක් මත රු. 250,000 උපරිමයකට යටත්ව කෘෂිකාර්මික ණය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/'10

ගරු රවි කරුණානායක මහතා,— පොලිතින්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම,— දිවයිනේ පොලිතින් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, ඒවා අනිසි ලෙස බැහැර කිරීමෙන් මහා පරිමාණයෙන් පරිසර දූෂණය සිදුවන බැවින් එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/'10

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100 කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/'10

ගරු රවි කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/'10

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/'10

ගරු රවි කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/'10

ගරු රවි කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

ගරු රවි කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

ගරු රවි කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

ගරු රවි කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා " තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

ගරු රවි කරුණානායක මහතා,— "නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" යනුවෙන් නාමයෙන් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'10

ගරු රවි කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

ගරු රවි කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවි කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවි කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ථ වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවි කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවි කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රීලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා, —පුත්තලම දිස්ත්‍රික්කය තුළ කාර්මික උද්‍යාන පිහිටුවීම, —කර්මාන්ත වැඩි දියුණු කිරීමේ හා තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබා දීමේ අදහසින් පුත්තලම දිස්ත්‍රික්කය තුළ කාර්මික උද්‍යාන පිහිටුවිය යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කල්මුනේ නගරය තුළ පිහිටි සාතන්කර්නි මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම,— දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ගේ විවිධ වූ ක්‍රීඩා කුසලතාවයන් හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා උසස් තත්වයේ පහසුකම් සපයාදීමේ අදහසින් කල්මුනේ නගරය තුළ පිහිටි සාතන්කර්නි මහජන ක්‍රීඩාංගනය සියලු පහසුකම් සහිත ජාත්‍යන්තර ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/'10

ගරු අජිත් කුමාර මහතා,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෞතුකාගාරයක් පිහිටුවීම,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පෞරාණික, සංස්කෘතික, සමාජමය වටිනාකමක් ඇති ස්ථානවල තොරතුරු ලබා ගත හැකි හා කෞතුක භාණ්ඩ සඳහා කෞතුකාගාරයක් පිහිටුවීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'10

ගරු අජිත් කුමාර මහතා,— අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීම,— සමාජයෙහි ව්‍යාප්තව යමින් පවතින අපරාධ අඩු කිරීමත්, අපරාධ නීති පද්ධතියේ පවතින අඩුපාඩු අඩුකර අපරාධ නීතිය සංශෝධනය කිරීමත්, අධිකරණය තුළ ගොඩගැසී ඇති ඉඩම් නඩු ඇතුලු නඩු විභාග අවසන් කිරීම හා අධිකරණය, පොලිසිය හා බන්ධනාගාර නවීකරණය කර කඩිනම් සේවයක් ලබා දීම සඳහාත් අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'10

ගරු අජිත් කුමාර මහතා,— දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්,— අතීතයේ සිට මේ දක්වා ජනතාව තමන් දරන දේශපාලන මතය නිසා පීඩාවට හා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ අයගේ පැමිණිලි විභාග කර සහන සැලසිය හැකි පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'10

ගරු අජිත් කුමාර මහතා,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් සතු ඉඩම්වල අයිතිය විවිධ හිමිකම් යටතේ පවතින අතර ඉන් බොහෝ දෙනෙක් අද ගොවියන් වන හෙයින් ද, ඉහත පනත මගින් අද ගොවි ක්‍රමය අහෝසි කිරීමේ හේතුවෙන් අද ගොවීන් ගොවි බිම් වලින් නෙරපා දමා ඇති අතර නීතිමය රැකවරණයක් නොමැතිකමින් විවිධ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින හෙයින් ද, අද ගොවීන්ට වූ එම අසාධාරණය දුරුලීම සඳහා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'10

ගරු අජිත් කුමාර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශිලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක් ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතු යැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවීව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'10

ගරු අජිත් කුමාර මහතා,— ශ්‍රී ලංකාවේ වටිනා ස්වභාවික සම්පත් හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම වටිනා ස්වාභාවික සම්පත් ලෙස සැලකෙන සිංහරාජ වනාන්තරය, කන්නෙලිය රක්ෂිත වනාන්තරය, රුමස්සල කන්ද, කොග්ගල ඔය දූපත් හා කඩොලාන පද්ධතිය, රම්සා තෙත් බිමක් වන මාදු ගඟ හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'10

ගරු අජිත් කුමාර මහතා,— ගාලු කොටුව හා ඒ ආශ්‍රිත ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම,— සංචාරක කර්මාන්තයේ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් වූ ද, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු වූ ද, ලෝක උරුමයක් ලෙස සැලකෙන ගාලු කොටුපවුර, ගාලු කොටුව ඇතුළත හා ගාලු කොටුව ආශ්‍රිතව ඇති ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන හා ජන සහභාගීත්වය ඇතිව විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අප රටට මෙම ඓතිහාසික උරුමයේ නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— ශ්‍රී ලංකාවේ ජීවත්වන අඩු පහසුකම් සහිත නිවාස හිමියන්ගේ නිවාස ප්‍රශ්න විසඳීමට ප්‍රායෝගික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම,—ශ්‍රී ලංකාවේ ජීවත්වන සෑම පවුලකටම ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් වන පානීය ජලය, විදුලිය, සනීපාරක්ෂක පහසුකම් හා මුළුතැන් ගෙයකින් සමන්විත නිවසක ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ තට්ටු නිවාස හා තට්ටු නිවාස පොකුරු යෝජනා ක්‍රම කොළඹ හා තදාසන්න නගරවල ඉදිකරමින් ජනතාවගේ නිවාස ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රායෝගික වැඩසටහනක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/'10

ගරු තිලංග සුමතිපාල මහතා,—කොළඹ නගරයේ වැසි ජලය බැස යාම ක්‍රමවත් කිරීම,— කොළඹ නගරයේ තවමත් පවතින්නේ වසර 100 කටත් වඩා පැරණි ජලය බැස යන කාණු පද්ධතියක් වන අතර එය නිසියාකාරව ක්‍රියාත්මක නොවන බැවින් පැය භාගයක පමණ අඛණ්ඩ වර්ෂාවකින් කොළඹ නගරයම ජලයෙන් යටවන තත්ත්වයකට පත්ව ඇති හෙයින්ද, අවිධිමත් ලෙස ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි හා අනවසර ඉදිකිරීම් වලින් පරිසරයට හානි සිදුවන හෙයින්ද, අධික වැසි අවස්ථාවලදී කොළඹ නගර සහා බල ප්‍රදේශය තුළ ඇතිවන ගංවතුර ආපදා තත්ත්වය අවම කිරීම සඳහා වැසි ජලය ක්‍රමවත්ව බැස යාමට හැකිවන පරිදි අදාළ කාණු පද්ධතිය නවීකරණය හා ශුද්ධ පවිත්‍ර කර විධිමත්ව පවත්වාගෙන යා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම,—දේශීය හා ජාත්‍යන්තර වෛද්‍ය ක්‍රමය තුළ වෘත්තීමය සුදුසුකම් හා අත්දැකීම නොමැති වෛද්‍යවරුන් හා වෛද්‍යවරියන් ප්‍රතිකාර කිරීමෙහි යෙදී සිටීම තුළින් සාමාන්‍ය රෝගී ජනතාවට විශාල ගැටලු වලට මුහුණ පෑමට සිදුවීමෙන් අසරණ තත්ත්වයකට පත්ව ඇති හෙයින් ද, ඒ තුළින් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ සිටින්නා වූ සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයන් සමාජය තුළ අවමානයට පත්ව

ඇති හෙයින්ද, වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීමට, ක්‍රමවත්ව හා විධිමත්ව නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'10

ගරු තිලංග සුමතිපාල මහතා,— මාධ්‍ය නිදහස හා තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළම තොරතුරු දැනගැනීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කර ඇති හෙයින් ද, තාක්ෂණය දියුණු වෙමින් පවතින ලෝකයක සත්‍ය සැඟවීමට හෝ වසන් කිරීමට අවස්ථාවක් නොමැති හෙයින් ද, ප්‍රජාතාන්ත්‍රික රටක සියලු පුරවැසියන්ට නිදහස් මාධ්‍ය තුළින් දැනුම හා අවබෝධය ලබාගැනීමේ අවකාශය ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'10

ගරු තිලංග සුමතිපාල මහතා,—ක්‍රීඩාව තුළින් නිරෝගීමත් සමාජයක් නිර්මාණය කිරීම,— ළමා අවධියේදීම දරුවන් ක්‍රීඩාවට යොමු කිරීම තුළින් නිරෝගීමත් සමාජයක් බිහිකිරීමටත්, සහජ කුසලතා ඇති දරුවන් ජාත්‍යන්තර තලයට යොමු කිරීමටත්, ලොව සුපතල ක්‍රීඩකයින් බිහි කර රටට කීර්තියක් ලබා ගැනීමටත් හැකිවන පරිදි ජාති භේදයෙන් පන්ති භේදයෙන් තොරවූ සාධාරණ ක්‍රම වේදයක් රාජ්‍ය මට්ටමින් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

ගරු රවී කරුණානායක මහතා, — ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කාදි අධිකරණ පද්ධතියට නිසි ස්ථානය ලබා දීම,— 1929 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත යටතේ කාදි අධිකරණ පද්ධතිය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කළ අතර ඉන් පසුව 1951 දී මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ සංශෝධනය කරන ලද එම ආඥාපනත මුස්ලිම් පවුල්වල පැනනගින ගැටලු පිළිබඳ සියළුම කාරණා සම්බන්ධ තීරණයන් ගැනීමට කාදි විනිශ්චයකාරවරුන්ගේ බල තල වැඩිකළ යුතු අතර එම පද්ධතියේ ගෞරවයට නිසි තැන ලබා දෙමින් නඩු විභාග වාර නිසි පරිදි පැවැත්වීමට කාදි අධිකරණ පද්ධතියේ තත්ත්වය උසස් කළ යුතු බව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කාදි විනිශ්චයකාරවරුන් පත්කරන බැවින් සෙසු අධිකරණ නිලධාරීන් හට හිමි වන ගරුත්වය හා පිළිගත් වැටුප් තලය මත ස්ථාන ගත කළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

ගරු රවී කරුණානායක මහතා,— මූළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—ආබාධිත හා විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට වෘත්තීය පුහුණුව ලබාදීම,—ආබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වෘත්තීය පුහුණුවක් දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් ලබා දී එම දරුවන් වඩාත් විධිමත් ආකාරයෙන් රැකියා අවස්ථාවලට යොමු කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් මුදල් සහ වරප්‍රසාද අපේක්ෂාවෙන් තොරව ඔවුන්ගෙන් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීමක් ලෙස සලකා විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට විශාල සේවාවක් ඉටු කරනු ලබන බැවින් එම සේවාවට ගරු කිරීමක් ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සියළුම දෙනාට සාමවිනිසුරු පදවි ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සාමවිනිසුරු තනතුරු ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— මුළු මහත් සමාජයම පොදුවේ පිළිගනු ලබන සහ සමාජයට විශාල සේවාවක් සපයනු ලබන තනතුරක් වන සාමවිනිසුරු තනතුරු ලබා දීමේදී ඒ සඳහා සුදුසු නිර්නායක පදනම් කොට ගෙන එම තනතුරු ලබා නොදීම නිසා එම තනතුරෙහි ගෞරවය හා පොදු පිළිගැනීම ක්‍රමයෙන් හීන වන බැවින් ඒ සඳහා පොදුවේ පිලිගත හැකි නිර්නායක පදනම් කර ගන්නා වූ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සුනාමි ඛේදවාචකයෙන් ඇතිවූ ගැටලු විසඳීම,— සුනාමි ඛේදවාචකය හේතුවෙන් කුමන හෝ ආකාරයේ ගැටලුවකට මුහුණ දී මේ වන තෙක් නොවිසඳී පවතින ගැටලු තිබේ නම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ මට්ටමින් සොයා බලා ඔවුන් මුහුණ දී ඇති හා දැනටත් මුහුණ දෙනු ලබන ගැටලු අවම කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායී කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදි සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම—, අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි හව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.84/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම—, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට

තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.85/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියළුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්,නියෝජ්‍ය පුරපතිවරයන්,නියෝජ්‍ය නගරාධිපතිවරයන්,උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියළුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතු යැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු

ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 97/'10

ගරු රුවන් රණතුංග මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා වන වාර්ෂික පොලී අනුපාතය 14% ක් ලෙස වැඩි කිරීම,— සංස්ථා, මණ්ඩල,අධිකාරී සහ පෞද්ගලික අංශය තුළ රට වෙනුවෙන් සැලකිය යුතු මෙහෙවරක් ඉටුකොට දැනට ජීවිතයේ සැඳෑ සමය ගෙවන බොහෝ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තමන්ගේ රැකියාවෙන් ඉතිරි කරගත් මුදල් හා අර්ථසාධක අරමුදල් ස්ථාවර තැන්පතුවල යොදවා ඊට ලැබෙන පොලියෙන් වර්තමානයේ ජීවත් වන අතර, රජයේ බැංකුවල වාර්ෂික පොලී අනුපාත 10.5% දක්වා අඩුකිරීම නිසා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලැබෙන පොලී ආදායම පහත වැටීම හේතුවෙන් ඔවුන් දැඩි අසීරුතාවයකට පත්ව සිටින බැවින්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රුපියල් ලක්ෂ 15 හෝ ඊට අඩු ස්ථාවර තැන්පතු වෙනුවෙන් වාර්ෂික පොලී අනුපාතය 14% ක් ලෙස වැඩි කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිලිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිලිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිලිබඳ කාරක සභාවක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරිම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 104/'10

ගරු.(අල්හාජ්)ඒ.එච්.එම්. අස්වර් මහතා,— තල් ගස් වගාව දිරිමත් කිරීම,- "කප්පගතරු" යන නමින් හැඳින්වෙන පොදු ජනතාවට ඉමහත් ප්‍රයෝජනවත් වන තල් ගස් වගාව දිරිමත් කිරීමෙන් තල් ආශ්‍රිත නිෂ්පදන ප්‍රවර්ධනයට සියලු පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/’10

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොල තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'10

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැගුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'11

ගරු රුවන් රණතුංග මහතා,— රාජ්‍ය බැංකුවල පොලී ගෙවීම සහ පොලී අයකිරීම අතර පවතින පරතරය අඩු කිරීම,— රාජ්‍ය බැංකුවල සාමාන්‍ය ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 4 % සිට 4.5 % දක්වාද ස්ථාවර තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 8 % පමණ ද වන අතර බැංකු විසින් නිවාස, ව්‍යාපාරික සහ කෘෂිකාර්මික වැනි ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතය 12 % සිට 13 % ක් ද පමණ වන බැවින් ජනතාවට සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට අතදීම සඳහාත් ඔවුන් දිරිගැන්වීම සඳහාත් මෙම අයකරන පොලිය සහ ගෙවන පොලිය අතර පවතින පරතරය අඩුකිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'11

ගරු රුවන් රණතුංග මහතා,— උපාධිධාරී ග්‍රාම නිලධාරීන් අගැයීම සඳහා දීමනාවක් ලබා දීම,— රාජ්‍ය සේවය ගම් මට්ටමින් ජනතාවට ලබා දීම සඳහා සේවය කරන ග්‍රාම නිලධාරීන් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් පසුව තරඟ විභාග ලකුණු මත බඳවා ගෙන ඇතත්, දැනට සේවයේ යෙදී සිටින ග්‍රාම නිලධාරීන් අතුරින් 30 % ක් 40 % ක් පමණ පිරිසක් උපාධි සුදුසුකම් ලබා ඇති අතර එයට කිසිදු සැලකිල්ලක් මෙතෙක් දක්වා නැති බැවින් උපාධි සුදුසුකම අගැයීම සඳහා උපාධිධාරී ග්‍රාම නිලධාරීන්ට වැටුප් වැඩිවීමක් හෝ දීමනාවක් ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුයයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.